# වාර්ෂික වාර්තාව

2013

**ජාතික පර්යේෂණ සභාව**

# පටුන


දැක්ම සහ මෙහෙවර 01

අරමුණු 02

සභාපතිතුමන්ගේ පණිවුඩය 03

කවුන්සිලය 04

කාර්යමණ්ඩලය 05

2013 වසර සඳහා සභාපතිතුමන් විසින් සිදුකළ සමාලෝචනය 06

විධායක ලේකම්ගේ වාර්තාව 07

පසුගිය වසර 3ක කාලසීමාව තුලදී අත්කරගත් මූල්‍යමය ජයග්‍රහණ 08

ජාතික පර්යේෂණ සභා වැඩසටහන් 11

ජා:ප:ස: අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රතිපාදන වැඩසටහන 14

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන 19

ඉලක්කගත බහු-විෂයයයික පර්යේෂණ ව්‍යාපෘති 20

මාධ්‍ය සහ සංවර්ධන වැඩසටහන 21

අවසාන ගිණුම් 2013 24

විගණකාධිපතිගේ වාර්තාව 38

සම්බන්ධවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු 51

# දැක්ම සහ මෙහෙවර

## දැක්ම

**"දැනුම හා විද්‍යාව පදනම් කරගත් සංවර්ධිත රටක තත්ත්වයට ශ්‍රී ලංකාව පත් කිරීම."**

## මෙහෙවර

**"මූලික හා ප්‍රායෝගික පර්යේෂණ ප්‍රවර්ධනය, මූල්‍යනය හා පහසුකම් සැපයීම සහ අධීක්ෂණය සහ ශ්‍රී ලංකාවේ මානව සම්පත් වර්ධනය තුලින් දැනුම හා විද්‍යාව පදනම් කරගත් සංවර්ධිත රටක තත්ත්වයට ශ්‍රී ලංකාව පත්කිරීම. "**

# අරමුණු

- ඉහළ මට්ටමේ ඵලදායීතාවයන්ගෙන් යුක්ත විද්වතුන්ට අමතරව පෞද්ගලික අංශයේ හා කර්මාන්ත අංශයේ නියෝජිතයන්ගේ සහභාගීත්වය ජාතික පර්යේෂණ සභාව වෙත ලබා ගැනීම;
- උසස් පර්යේෂණ උපාධි සඳහා ලියාපදිංචිව සිටින පර්යේෂණ සිසුන්ගේ අවශ්‍යතා සැපයීමෙන් සියළුම විද්‍යාත්මක දැනුම් ක්ෂේත්‍රයන්හී මූලික හා ව්‍යවහාරික පර්යේෂණ ප්‍රවර්ධනය හා මානව සම්පත් සංවර්ධනයට පහසුකම් ඇති කිරීම;
- රාජ්‍ය අංශයේ සෑම විද්‍යාත්මක පර්යේෂණ ආයතනයකටම පර්යේෂකයින්ගේ පර්යේෂණ ප්‍රයත්නය සැලසුම් කිරීම හා සම්බන්ධීකරණය කිරීම;
- රාජ්‍ය අංශයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී තනි තනි පර්යේෂණ කටයුතුවලට පහසුකම් සැපයීම සහ කාර්ය සාධනය ඇගැයීමට ලක් කර එකී පර්යේෂණවලට අවශ්‍ය මුදල් යෙදවීමට කලින් කලට ජනාධිපති කාර්යාලය මඟින් මහා භාණ්ඩාගාරයට නිර්දේශ කිරීම;
- රාජ්‍ය අංශයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන හා විශ්වවිද්‍යාලවල පර්යේෂකයින් අතර උපාධි ප්‍රදානය අරමුණු කොට ක්‍රියාත්මක කෙරෙන සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් ප්‍රවර්ධනය, ඒවාට අවශ්‍ය මුදල් යෙදවීම හා ඒවාට පහසුකම් සැලසීම;
- කර්මාන්ත, විශ්වවිද්‍යාල සහ රාජ්‍ය අංශයේ විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන ආයතන අතර පැවැත්වෙන සහයෝගීතා වැඩසටහන් ප්‍රවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම;
- සාර්ථක පර්යේෂණ හා නවීකරණයන් සඳහා ජාතික මට්ටමේ පිළිගැනීම හා ප්‍රදානයන් සිදුකෙරෙන ක්‍රම ඇති කිරීම;
- ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන අවශ්‍යතාවන්ට ඵලදායී ප්‍රතිචාරයක් දක්වන විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ සංස්කෘතියක් හා ප්‍රජාවක් පෝෂණය කිරීම හා පවත්වාගෙන යාම;

# සභාපතිතුමන්ගේ පණිවුඩය

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ පර්යේෂණ මූල්‍යානය කිරීමේ ප්‍රමුඛතම ආයතනය වන ජාතික පර්යේෂණ සභාවේ 2013 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් සිය ව්‍යවස්ථාමය බලතල යටතේ, මහින්ද චින්තන ඉදිරි දැක්ම සංවර්ධන සැලැස්ම ඉටුකර ගැනීම සඳහා ජාතික පර්යේෂණ සභාව පිහිටුවනු ලැබිණි.

මෙම කාලසීමාව තුලදී, අතිගරු ජනාධිපතිතුමන් විසින් සභාව තුල පුළුල් නියෝජනයක් ඇති වන අයුරින් ජාතික පර්යේෂණ සභාවේ සංයුතියෙහි වෙනස්කම් සිදුකරනු ලැබූ අතර, සභාපති ධූරය සඳහා මා පත් කරන ලදී.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් පර්යේෂණ අංශය හා සම්බන්ධිත වැදගත් ක්ෂේත්‍රයන් 10ක් හඳුනා ගනු ලැබ ඇති අතර මෙම ක්ෂේත්‍රයන් හා අනුගතව ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘති වැඩසටහනක් හඳුන්වා දීමට ජාතික පර්යේෂණ සභාවෙහි නව කවුන්සිලය විසින් පියවර ගනු ලැබ ඇත. මෙම ව්‍යාපෘති යටතේ වසර 05ක කාල සීමාවක් තුලදී රු.මිලියන 50ක් දක්වා වූ ප්‍රතිපාදනයන් විද්‍යාඥයින්ගෙන් සමන්විත වූ කණ්ඩායම් වෙත ලබා දෙනු ලබන අතර අප විසින් මූල්‍යානය කරනු ලබන පුද්ගල අන්වේෂක මත පදනම් වූ ව්‍යාපෘතීන්ට වඩා සැලකිය යුතු මට්ටමින් ඉහළ ප්‍රතිපාදනයන් මේ යටතේ ප්‍රදානය කෙරේ. රටෙහි පවත්නා ප්‍රධාන ගැටළු පර්යේෂණ මඟින් විසඳා ගැනීම අරමුණු කර ගනිමින් එකිනෙකා සමඟ සහයෝගීතාවයන් ගොඩනංවා ගන්නා ලෙස ඉල්ලමින් ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් සමඟ පවත්වනු ලැබූ සාකච්ඡාවන් හා හමුවන් සමඟ මෙම වැඩසටහන ආරම්භ කරනු ලැබිණි.

මහින්ද චින්තන සංවර්ධන රාමුව හරහා ද පර්යේෂණ තුලින් ආර්ථික සංවර්ධනය කඩිනම් කරවීමේ අරමුණින් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ සහයෝගීතාවයන් ස්ථාපනය කර ගැනීම සඳහා සහාය ලබාදීම කෙරෙහි අවධානය යොමු කෙරෙන අතර අප ආයතනය යටතේ ක්‍රියාත්මක කෙරෙන රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන මඟින් සිදු කෙරෙන්නේ ද එම කාර්යයමය.

පසුගිය වසර කිහිපය තුලදී, අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදානයන් හරහා අපගේ විශ්වවිද්‍යාලයන් සහ රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතනයන්හී යටිතලයන් සංවර්ධනය සඳහා සහාය ලබා දීමට අප ආයතනයට හැකියාව ලැබිණි. මේ හරහා මෙම ආයතනයන්හී පර්යේෂණ ශක්‍යතාවයන් වර්ධනය කර ගැනීමේ හැකියාව උදාවී ඇත. පෞද්ගලික සහ රාජ්‍ය අංශය අතර පර්යේෂණ සහයෝගීතාවයන් ගොඩනංවා ගැනීම සහ අපගේ ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන් හරහා සහයෝගීතාවයන් පවත්වා ගැනීම සඳහා විද්‍යාඥයින් දිරිගැන්වීම සඳහාත් දැන් අවධානය යොමු වී ඇත.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමාට සහ අමාත්‍යාංශ ලේකම්තුමිය වන ධාරා විජයතිලක මැතිණියට ද, ඔවුන් විසින් ජාතික පර්යේෂණ සභාව වෙත ලබාදුන් සහ අඛණ්ඩව ලබාදෙන සහාය වෙනුවෙන් මහත් සේ කෘතඥ වෙමි.

**මහාචාර්ය එච්.ජේ. ද සිල්වා**
**සභාපති**

# කවුන්සිලය

ගෙවී ගිය වර්ෂය තුලදී ජාතික පර්යේෂණ සභාවේ කවුන්සිලයෙහි ජනාධිපති නියෝගයක් මත වෙනස්කම් සිදුකරන ලදී.

**<u>2013.07.07 සිට 2013.12.31 දක්වා කවුන්සිලය</u>**

**සභාපති**

1. මහාචාර්ය හිතනාදූර ජනක ද සිල්වා

**අනෙකුත් සාමාජිකයින්**

2. මහාචාර්ය කාමිනී නිර්මලා මෙන්ඩිස්
3. මහාචාර්ය ආනන්ද රාජිත වික්‍රමසිංහ
4. මහාචාර්ය හේමා මාලනී කුඹල්ගොඩ කංකානම් පතිරණ
5. මහාචාර්ය හේමන්ති රණසිංහ
6. මහාචාර්ය විජේරූපගේ සන්ධ්‍යා සුලෝචනා විජේසුන්දර
7. මහාචාර්ය ලක්ෂමන් ලොයිඩ් රත්නායක
8. මහාචාර්ය අවුරේලියා ජෙනිෆර් පෙරේරා
9. මහාචාර්ය දෙල්ගහවත්තේ රාජ් කුමාර් සෝමදේව දෙල්ගහවත්ත
10. මහාචාර්ය විරංජිත් ප්‍රියාන් සොලමන් ඩයස්
11. මහාචාර්ය කතිරගාමනාතන් කන්දසාමි
12. මහාචාර්ය අරුණි තිලකරත්න
13. ආචාර්ය නන්ද අමරසේකර
14. ආචාර්ය රොහාන් ප්‍රසන්ත පෙරේරා
15. ආචාර්ය ගලබඩ ආරච්චිගේ සිරිමල් ප්‍රේමකුමාර
16. ආචාර්ය නිහාල් ජිනසේන
17. ඉංජිනේරු. මොක්සෙවි ප්‍රේලිස් මහතා

**භාණ්ඩාගාර නියෝජිත**

18. ඩී. සේනානායක මිය

**<u>2013.01.01 සිට 2013.07.14 දින දක්වා කවුන්සිලය</u>**

**සභාපති**

1. මහාචාර්ය  උල්පාගොඩ පතිර-ආරච්චිගේ එරික් හැමිල්ටන් කරුණානායක

**අනෙකුත් සාමාජිකයින්**

2. මහාචාර්ය මොහොමඩ් අබ්දුල් කරීම්
3. මහාචාර්ය වීරතුංග ආරච්චිගේ ජනේන්ද්‍ර මාතලී ද කොස්තා
4. මහාචාර්ය හිතනාදූර ජනක ද සිල්වා
5. මහාචාර්ය විරංජිත් ප්‍රියාන් සොලොමන් ඩයස්
6. මහාචාර්ය ඊ.ආර්. ජැන්ස්

7. දේශමාන්‍ය ඉංජිනේරු ආචාර්ය නිහාල් ජිනසේන
8. මහාචාර්ය කතිරගාමනාතන් කන්දසාමි
9. මහාචාර්ය අටුලුගමගේ ආසිරි නානායක්කාර
10. මොක්සෙව්ප්‍රේලිස් මහතා
11. ආචාර්ය ගල්බඩ ආරච්චිගේ සිරිමල් ප්‍රේමකුමාර
12. වෛද්‍ය සැම්සන් රාජපක්ෂ
13. මහාචාර්ය කීර්ති තෙන්නකෝන්
14. මහාචාර්ය මර්වින් අයිරාංගනී තාබෲ
15. ආචාර්ය අරුණි තිලකරත්න

**භාණ්ඩාගාර නියෝජිත**

16. ඩී. සේනානායක මිය

# කාර්ය මණ්ඩලය

2013.12.31 වන දිනට

විධායක ලේකම් : එම්.සී. රාජපක්ෂ
ගණකාධිකාරී : එන්.එස්. හේවාගම

| | |
|---|---|
| සහකාර ගණකාධිකාරී / පර්යේෂණ නිලධාරී | එස්.කේ. ගම්හේවා |
| විද්‍යාත්මක නිලධාරී | එස්. සරත්චන්ද්‍ර |
| විද්‍යාත්මක නිලධාරී | එස්. නෝනිස් |
| විද්‍යාත්මක නිලධාරී | එච්. ප්‍රියශාන්ති |
| ගිණුම් නිලධාරී | ජ්.කේ.ඩී.එම්. පෙරේරා |
| වැඩසටහන් සහකාර | ජ්.ඊ.කේ. දයාරත්න |
| රියදුරන් | කේ.කේ.ටී. සඳරුවන් |

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ පුහුණු අභ්‍යාසලාභී එස්.එච්.එස්. ප්‍රියන්කර

# 2013 වසර සඳහා සභාපතිතුමන්ගේ සමාලෝචනය

ගෙවී ගිය වසර ජාතික පර්යේෂණ සභාව සඳහා සාර්ථක වර්ෂයක් වූ අතර නව කවුන්සිලය පත්කිරීමත් සහ දැනට ක්‍රියාත්මක වත්මන් වැඩසටහන් වඩා විධිමත් කිරීමත් සහ නියෝගාත්මකව පැවරී ඇති අරමුණු ළඟා කර ගනු පිණිස නව වැඩසටහන් හඳුන්වාදීමත් සිදු කෙරිණි.

2013 මුදල් වර්ෂය සඳහා වූ ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කරනුයේ මහත් සතුටිනි.

මෙම කාලච්ඡේදය තුළදී, මෙම සභාවේ සංයුතිය පුළුල් නියෝජනයකින් යුක්ත වන පරිදි වෙනස්කම් සිදු කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් පියවර ගනු ලැබිණි.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් පර්යේෂණයන් සිදු කළ යුතු වැදගත් ක්ෂේත්‍ර 10ක් හඳුනාගනු ලැබූ අතර මෙම ක්ෂේත්‍රයන් හා අනුකූලව ජාතික පර්යේෂණ සභාවේ නව කවුන්සිලය විසින් ඉලක්ක මත පදනම් වූ සුවිශාල බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහනක් මෙරටට හඳුන්වා දෙනු ලැබිණි. ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ට ඒකරාශී වී පර්යේෂණ හරහා රටෙහි පවතින උග්‍ර ගැටළු සඳහා විසඳුම් ලබාදෙනු පිණිස එක්වන ලෙස ඉල්ලමින් පවත්වනු ලැබූ සාකච්ඡාවන් සහ හමුවන් සමඟ මෙම වැඩසටහන වහා ආරම්භ කරනු ලැබිණි.

මහින්ද චින්තන සංවර්ධන රාමුව යටතේ පර්යේෂණ හරහා ආර්ථික සංවර්ධනය කඩිනම් කරවීමේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගීතාවයන් සඳහා සහාය පළ කිරීමට වැඩි අවධානයක් යොමු වී ඇත.

පසුගිය වසර කිහිපය තුල, රටේ සංවර්ධනය සඳහා මඟ පෙන්වන අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන හරහා, විශ්වවිද්‍යාලයන්හී යටිතල මූලාශ්‍රයන් වැඩිදියුණු කිරීම සඳහා අප ආයතනය විසින් මහත් පරිශ්‍රමයක් දරණු ලැබිණි. වත්මන මේ සඳහා යොමු වූ අවධානය තරමක් ඉන් බැහැරව රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් අතර පර්යේෂණ සහයෝගීතාවයන් ගොඩනැංවීම සඳහා සහ ඉලක්ක මත පදනම් වූ සුවිශාල බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන් වෙත යොමු වී ඇත.

2013 වසර අවසාන වන විට, දර්ශනපති / ආචාර්ය උපාධි අධිශිෂ්‍යත්ව 36ක් සමඟ නව අන්වේෂක මත පදනම් වූ නව පර්යේෂණ ප්‍රදාන 41ක් ආරම්භ කරනු ලැබූ අතර, රාජ්‍ය සහ පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘතීන් 4ක, සහයෝගීතා ගිවිසුම් අත්සන් තැබීම ආරම්භ විය.

2007, 2008 සහ 2009 යන වර්ෂයන්හී විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය 2014 ජනවාරි 17 දින පැවැත්වීමට නියමිතව තිබූ අතර, මෙම වසර අවසානභාගය තුල එම උළෙල සඳහා සූදානම් වීම අඛණ්ඩව සිදු කෙරිණි.

2013 අම්පාරේ දී පවත්වනු ලැබූදැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ව්‍යාපෘතීන් හී සොයාගැනීම් ජනතාව හමුවට ගෙන ඒම සඳහා අනගි වේදිකාවක් සැපයූ අතර පර්යේෂණ ව්‍යාපෘතීන් කිහිපයක් එම ප්‍රදර්ශනය සඳහා සහභාගී විණි.ජාතික සංවර්ධනය සඳහා ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදානයන් විසින් දක්වනු ලැබූ දායකත්වය පිළිබඳ දේශීය පුවත්පත් හී ලිපි ගෙවී ගිය වසර තුලදී පළවිණි.

ඉදිරි වසර තුලදී, රජය විසින් රටෙහි සංවර්ධනය සාක්ෂාත් කිරීම උදෙසා රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර සහයෝගීතා සවිමත් කරමින් සහ පර්යේෂණ ප්‍රජාව සහ ව්‍යාපාරික ප්‍රජාව අතර පවතින පරතරය අවම කරමින් පර්යේෂණ හා තාක්ෂණ අංශයේ සිදුකරන ආයෝජනයන් අඛණ්ඩව සිදු කෙරෙනු ඇත. ආර්ථික සහ දැනුම් මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීමේ අරමුණ සඳහා වැඩි දායකත්වයක් ජාතික පර්යේෂණ සභාව විසින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් පෙළ හරහා දැක්වීමට හැකිවනු අතර එහි අවසන් ප්‍රතිඵලය ලෙස රටෙහි ජනතාවට වැඩි ප්‍රතිලාභ අත්වනු ඇත.

# විධායක ලේකම්ගේ වාර්තාව

ජාතික පර්යේෂණ සභාව යනු, ශ්‍රී ලංකාවේ උසස් විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් නිකුත් කරනු ලැබූ විශේෂ නියෝගයක් මත විධිමත්ව පිහිටුවන ලද ජාතික මූලායන ආයතනයකි. සභාපති හා කවුන්සිලය විසින් එහි කාර්යයන් පාලනය කෙරේ. 2013 සැප්තැම්බර් මස දී නව කවුන්සිලයක් පත්කරනු ලැබූ අතර සභාපති තනතුර සඳහා මහාචාර්ය ජානක ද සිල්වා මහතා පත්කරනු ලැබිණි. ජාතික පර්යේෂණ සභාව ආරම්භයේ සිටම එහි කවුන්සිලයේ සාමාජිකයකු ලෙස එතුමා ක්‍රියා කළේය.

2013 මූල්‍ය වර්ෂය තුළදී ජාතික පර්යේෂණ සභාව විසින් විද්‍යාත්මක පර්යේෂණ සඳහා පහසුකම් සැපයීමේ සිය වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. දැනට ක්‍රියාත්මක සෑම වැඩසටහනක්ම නැවත විමර්ශනය කොට වෙනස්කම් සිදුකරනු ලැබූ අතර ජාතික පර්යේෂණ සභාවේ අරමුණු ළඟාකර ගැනීම සඳහා නව වැඩසටහන් හඳුන්වාදෙනු ලැබිණි. දැනට ක්‍රියාත්මක වැඩසටහන් වනුයේ, අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන (1999), පෞද්ගලික - රාජ්‍ය සහයෝගීතා වැඩසටහන (2012), ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන (2013), විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන (2001) සහ වෙනත් වැඩසටහන් (Research to Development : R2D & Public Awareness programme).

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ වැඩසටහන සඳහා ගෙවීගිය වර්ෂයේදී ප්‍රමුඛත්වය ලැබිණි. නව කමිටු 2ක් එනම්, ප්‍රතිපාදනයන්හී ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා කාර්යසාධන සහ ඇගැයීම් කමිටුවද, කවුන්සිලය වෙත මූල්‍යමය කරුණු පිළිබඳ නිර්දේශ කිරීම සඳහා විගණන සහ කළමනාකරණ කමිටුවද පත්කරනු ලැබිණි. මෙම කමිටු 2 පත්කිරීම හරහා ජාතික පර්යේෂණ සභාවේ අභ්‍යන්තර ක්‍රියාවලීන් සඳහා පහසුකම් සැපයේ.

මෙම වර්ෂය තුළදී නව ප්‍රදාන 41ක්, සහයෝගීතාවයන් 74ක සහභාගීත්වයෙන් පිරිනමනු ලැබිණි. ජාත්‍යන්තර ප්‍රකාශන 12ක් සමඟ ප්‍රදානයන් 12ක් සම්පූර්ණ කෙරිණි. පර්යේෂණයන්හී සොයාගැනීම් දේශීය හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 47කදී ඉදිරිපත් කෙරිණි. ව්‍යාපෘති 3ක් මඟින් රෝග නිර්ණ සේවාවන් ලබාදුන් අතර පශ්චාත් උපාධි ශිෂ්‍යයින් 6දෙනෙකු විසින් ඔවුන්ගේ ආචාර්ය / දර්ශනපති උපාධිය සම්පූර්ණ කරන ලදී.

පෞද්ගලික අංශයේ පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවන් ප්‍රවර්ධනය කෙරෙන, පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා (PPP) වැඩසටහන්හී පළමු ප්‍රදානයන් 4 මෙම වසර තුළදී පිරිනමන ලදී. මෙම ප්‍රදානයන්හී සුවිශේෂී ලක්ෂණයක් වූයේ පර්යේෂණයන් සිදු කිරීමේදී පෞද්ගලික අංශය විසින් දක්වන ලද සහභාගීත්වය, සහයෝගීතාවය හා ව්‍යාපෘතියේ මුළු වියදමින් 50%ක ප්‍රතිශතයක් සඳහා දායකත්වය දැක්වීමයි.

දැවෙන ජාතික ගැටළු සඳහා පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් හරහා විසඳුම් සොයාගනු පිණිස ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ වැඩසටනක් ගෙවීගිය වසර තුළදී හඳුන්වාදෙනු ලැබිණි. මූල්‍යනය කිරීමේ සමස්ත යෝජනා ක්‍රමය කවුන්සිලය විසින් වැඩිදියුණු කරනු ලැබිණි. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් හඳුනාගනු ලැබූ වැදගත් ක්ෂේත්‍ර 10ක් මත පදනම්ව අයැදුම්පත් කැඳවනු ලැබූ අතර වසරේ අගභාගය තුළදී මූලික තෝරාගැනීම් ක්‍රියාවලිය ආරම්භ කෙරිණි.

ලබන වසරේ මුල්භාගයේදී 2006 / 2007 / 2008 යන වර්ෂයන්හී පළවූ ප්‍රකාශනයන් වෙනුවෙන් විද්‍යාත්මක ප්‍රකාශන වැඩසටහන් සඳහා ජනාධිපති සම්මාන උළෙල පැවැත්වීමට සියළු කටයුතු සූදානම් කොට ඇත. වටිනා පර්යේෂණ ප්‍රතිඵලයන් ජනතාව වෙත රැගෙන යාම සඳහා මහජන දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පවත්වනු ලැබූ අතර දේශීය පුවත්පත්හී ලිපි 36ක් පළකරනු ලැබිණි.

ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදාන මඟින් සිදුකරන පර්යේෂණයන් තුළින් දරණ ආයෝජනයන්ට ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන පරිදි පර්යේෂණයන් ඉටුකරන බවට වගබලා ගැනීමට ජාතික පර්යේෂණ සභාවේ කාර්යාලයෙහි අපි නොමඳව කැපවී සිටිමු. ජාතික පර්යේෂණ සභාව ඉහළ තලයකට රැගෙන යාම සඳහා අප දරණ ප්‍රයත්නයන්හීදී ඒ සඳහා සිය අනගි දායකත්වය ලබාදුන් සභාවේ සාමාජිකයින්ටත්, මෙම වසර තුළදී අප හට දුන් සහාය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට සහ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයටත් මාගේ ස්තූතිය පිරිනැමීමට කැමැත්තෙමි.

වාර්ෂික වාර්තාව ඔබට ඉදිරිපත් කරන මෙම අවස්ථාවේදී ජාතික පර්යේෂණ සභාවේ මෙන්ම මගේද සුභාශිංසනය ඔබ සැමට පිරිනමමි.

**මනීෂා සී. රාජපක්ෂ,**
විධායක ලේකම්.

# පසුගිය වර්ෂ 3ට අදාළ මූල්‍ය සුවිශේෂීතාවයන්

| වැඩසටහන් (ක්‍රමෝපායන්) | | භෞතික ප්‍රගතිය | | | මූල්‍යමය ප්‍රගතිය රු. මිලියන | | |
|---|---|---|---|---|---|---|---|
| | දර්ශකය | 2011 | 2012 | 2013 * | 2011 | 2012 | 2013 * |
| ජාතික පර්යේෂණ සභාවේ පොදු පරිපාලනය | | | | | 6.3 | 9.48 | 10.815 |
| පහත වැඩසටහන් සඳහා සංවර්ධන ආධාර | | | | | 213.9 | 229.02 | 245.77 |
| පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | - | - | වැඩසටහන් 4ක් ආරම්භ කෙරිණි | | | |
| ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන | තෝරාගත් පර්යේෂණ ප්‍රදාන ගණන / අයැදුම්පත් ගණන<br>ආචාර්ය උපාධි / දර්ශනපති සිසුන් | අයැදුම්පත් 200ක් අතුරින් පර්යේෂණ සහ ආචාර්ය උපාධි ප්‍රදාන 51ක් පිරිනැමීම<br>ආචාර්ය උපාධි / දර්ශනපති උපාධි 67ක් පිරිනැමීම | පර්යේෂණ සහ ආචාර්ය උපාධි ප්‍රදාන 58ක් පිරිනැමීම<br>ආචාර්ය උපාධි / දර්ශනපති උපාධි 67ක් පිරිනැමීම | පර්යේෂණ සහ ආචාර්ය උපාධි ප්‍රදාන 41ක් පිරිනැමීම<br>ආචාර්ය උපාධි / දර්ශනපති උපාධි 36ක් පිරිනැමීම | - | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| විද්‍යාත්මක ප්‍රකාශන වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන | පවත්වනු ලැබූ උත්සව සංඛ්‍යාව හා සම්මානලාභී විද්‍යාඥයින් සංඛ්‍යාව | 2007, 2008 සහ 2009 සඳහා විද්‍යාඥයින්ට සම්මාන ප්‍රදානය කිරීමේ දත්ත ගබඩාව සම්පාදනය කිරීම අඛණ්ඩව සිදු කෙරිණි. | 2007, 2008 සහ 2009 සඳහා විද්‍යාඥයින්ට සම්මාන ප්‍රදානය කිරීමේ දත්ත ගබඩාව සම්පාදනය කිරීම සම්පූර්ණ කෙරිණි. | විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල සඳහා සූදානම් වීම අඛණ්ඩව සිදු කෙරිණි. | - | - | - |
| | | | | | | | |
| වෙනත් වැඩසටහන් | සම්පූර්ණ කරනු ලැබූ ක්‍රියාකාරකම් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමාලෝචනයට ලක් කරනු ලැබූ අතර සමාලෝචන වාර්තාව ජනාධිපතිතුමන් වෙත ඉදිරිපත් කරන ලදී.<br><br>දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගී වූ අතර තරුණ විද්‍යාඥයින්ගේ වැඩසටහන ආරම්භ කරනු ලැබිණි. | -දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගී විය. | සමුද්‍ර විශ්වවිද්‍යාලයෙහි පුහුණු වැඩසටහන ස්ථාපනය කෙරේ - මහාචාර්ය එන්.ඩී. කොඩිකාර / ජා:ප:ස: ප්‍රදාන 11 - 065<br><br>ව්‍යුහාත්මක ඉංජිනේරුමය ඉදිකිරීම් හා කළමනාකරණය පිළිබඳ මූලික සම්මන්ත්‍රණය මහනුවරදී පැවැත්වීම සඳහා ජාතික පර්යේෂණ සභාව මඟින් පහසුකම් සලසාදෙනු ලැබිණි - ආචාර්ය පී.බී.ආර්. දිසානායක / ජා:ප:ස: ප්‍රදාන 11 - 106 | - | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | මහාචාර්ය සී. ලියනගේ සහ වෛද්‍ය එම්. හෙට්ටිආරච්චි විසින් නවජ ළඳරු පරීක්ෂා වැඩසටහන පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වන ලදී. එය ප්‍රතිපත්තියක් ලෙස වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ එකඟත්වය පළවිණි. (ජා:ප:ස: ප්‍රදාන 08 – 08 සහ 11 – 160)<br><br>දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සහභාගී විය. | | | |
| එකතුව | | | | | 220.2 | 238.5 | 256.585 |

*තාවකාලික

# ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන්

වසරේ මැද භාගයේදී ජනාධිපති නියෝගයක් මඟින් වර්තමාන කවුන්සිලය පත්කිරීමත් සමඟ 2013 වසර ජාතික පර්යේෂණ සභාවේ වෙනස්කම් රාශියක් සිදු වූ අතර ජාතික පර්යේෂණ සභාවේ ක්‍රියාකාරකම් සඳහා නව වැඩසටහන් හඳුවන්වා දෙමින් වැඩසටහන්හී ව්‍යූහාත්මක වෙනස්කම් සඳහා මඟ පෑදිනි.

ප්‍රධාන වැඩසටහන්;

- අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන
- විද්‍යාත්මක පර්යේෂණ වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන
- රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන
- ඉලක්කගත බහු-විෂයයයික පර්යේෂණ ව්‍යාපෘති
- වෙනත් වැඩසටහන්

**අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන**

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සහ විශ්වවිද්‍යාල විසින් සිදු කෙරෙන පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍යාධාර සැපයෙනුයේ රාජ්‍ය ආයතනික ප්‍රතිපාදන, තරඟකාරී ප්‍රදාන සහ පර්යේෂණ කොන්ත්‍රාත්තු වැනි විවිධ ප්‍රභවයන් වෙතිනි. ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන ආරම්භ කරනු ලැබුයේ විද්‍යාඥයින්හට අවම නිලධාරීවාදී අතපෙවීම් යටතේ සිය පර්යේෂණ කාර්යයන්හී නියැලීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීමේ අරමුණෙනි.

ජාතික පර්යේෂණ සභාවෙහි පර්යේෂණ ප්‍රදාන වැඩසටහන හරහා රජයේ ආයතන සඳහා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම පිණිස තරඟකාරී ප්‍රදානයන් ලබා දීම සිදු කෙරේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ කාලසීමාව තුල එය මනාව සංවිධිත කරනු ලැබිණි. මෙම ප්‍රදානයන් පිළිබඳව වාර්ෂිකව දැන්වීම් පළකෙරෙන අතර, විද්‍යාත්මක අංග, ජාතික සංවර්ධනය සඳහා ඇති අදාලත්වය සහ ජාත්‍යන්තර සඟරාවන්හී මෙම සොයාගැනීම් පළවීම යන කරුණු මත ඇගයීම සිදු කෙරේ. අයදුම්පත් දැඩි ඇගයීමේ ක්‍රියාවලියකට ලක් කෙරේ. තෝරාගනු ලබන යෝජනාවන් සඳහා සුදුසු ප්‍රතිපාදන වෙන්කිරීම් පිළිබඳව සභාව විසින් තීරණය කෙරෙනු ඇති අතර මෙම ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයේ සිට සෘජුවම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ තනි වගකීම දරණ ප්‍රධාන විමර්ශකයා වෙත ලබාදේ. උපකරණ සහ පාරිභෝගික ද්‍රව්‍ය ආදිය සඳහා මෙම ප්‍රතිපාදන වෙන්කෙරේ. එක් එක් ව්‍යාපෘතිය සඳහා ව්‍යපෘති බැංකු ගිණුමක් විවෘත කෙරෙන අතර ජාතික පර්යේෂණ සභාව විසින් සියළු ගණුදෙණු සුපරීක්ෂණය කෙරේ. නිලධාරීවාදී අතපෙවීම් අවම මට්ටමක තබා ගිනිමින් මෙම අරමුදල් ප්‍රයෝජනයට ගැනීම සඳහා සැලකිය යුතු අන්දමේ නම්‍යශීලීතාවයක් මේ හරහා විද්‍යාඥයින්ට ලැබේ. සුපරීක්ෂණය සහ ඇගැයීම් සභාව සහ ජාතික පර්යේෂණ සභාවෙහි කාර්යාලය මඟින් සිදු කෙරේ.

වත්මනදී ප්‍රදානය කෙරෙනු ලබන ප්‍රදානයන් ස්වභාවයෙන් විවිධාකාර වන බව මෙහිදී සඳහන් කළ යුතුය. විද්‍යාව සහ ආහාර, ජලය, පරිසරය හා බලශක්ති යන ක්ෂේත්‍රයන් පිළිබඳව පර්යේෂණ මූල්‍යායනය කිරීමට අමතරව ජාතික පර්යේෂණ සභාව විසින් ජාතික ආවේක්ෂනය, වාරිමාර්ග පද්ධතීන්, වනජීවී සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය, කථන පරිවර්තන, ඉදිකිරීම් සහ ගෘහ නිර්මාණ ශිල්පය, දුම්රිය ගමනාගමනය, ක්‍රීඩා සහ තවත් බොහෝමයක් ක්ෂේත්‍රයන්හී පර්යේෂණ ද මෑතක සිට මූල්‍යායනය කෙරේ.

බහු විෂයානුබද්ධ ප්‍රවේශයන් සහිත කණ්ඩායම් පර්යේෂණ, සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් සහ ගැටළු මත පදනම් වූ පර්යේෂණයන් දිරිගැන්වේ. මෙම වසරේ සිට තරුණ විද්‍යාඥයින් සඳහා

පර්යේෂණ ආරම්භ කිරීමේ ප්‍රදානයන් සහ පශ්චාත් ආචාර්ය උපාධි අධිශිෂ්‍යත්ව ප්‍රදානය කෙරෙනු ඇත. සරල නමුත් අංගසම්පූර්ණ තනි අයැදුම්පත්‍ර කට්ටලයක් සියළු වැඩසටහන් සඳහා ලබාගත හැක. ගෙවීගිය වර්ෂයන් සමඟ අප වෙත ලැබෙන අයැදුම්පත් සංඛ්‍යාව ඉහළයාම යහපත් ලකුණකි. මෙම වැඩසටහන හමුවේ ඇති අභියෝගය වන්නේ දැනටමත් අප විසින් අත්කරගනු ලැබ ඇති ගැම්ම ඒ අයුරින්ම පවත්වාගෙන යාමයි.

අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදානයන්හී අමතර ප්‍රතිඵලයක් ලෙස ආචාර්ය උපාධි / දර්ශනපති උපාධි බිහිකරමින් පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම සඳහා වත්මන් කවුන්සිලය විසින් මෙම වසර තුලදී ආචාර්ය / දර්ශනපති උපාධි ජනනය කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන ලදී.

මහජනතාවට සහ වෙනත් ප්‍රතිලාභී පාර්ශවයන් සඳහා උපරිම ප්‍රතිඵල ලබාදෙන අයුරින් මෙම වැඩසටහන හැඩගස්වා ගැනීම සඳහා නව නීති රීතීන් සහ මාර්ගෝපදේශනයන් විශාල සංඛ්‍යාවක් කවුන්සිලය විසින් හඳුන්වාදෙනු ලැබිණි.

**විද්‍යාත්මක පර්යේෂණ වැඩසටහන සඳහා ජනාධිපති සම්මාන**

පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ වැඩසටහන 2001 වසරේදී ආරම්භ කරනු ලැබුයේ ජාත්‍යන්තර තලය කරා ළඟාවූ විද්‍යාඥයින්ට බුහුමන් දැක්වීම, ජාතික විද්‍යාත්මක නිෂ්පාදනයන් ඉහළ නැංවීම සහ බුද්ධිගලනය වැළැක්වීම යන අභිමතාර්ථයන් පෙරදැරිවය. 1991 සිට 2006 දක්වා ප්‍රකාශනයන් එළිදැක්වීම පිළිබඳ ජාතික සංඛ්‍යාලේඛන මඟින් පෙන්වා දෙන්නේ ඉහළ නැඟීමේ ප්‍රවනතාවයෙහි මූලාරම්භය විය හැකිය.

මෙම වැඩසටහන නිර්මාණය කරනු ලැබුයේ ආතර් සී ක්ලාක් ශ්‍රීමතානන්, මහාචාර්ය අරිස් කොවූර් සහ ජාතික පර්යේෂණ සභාවෙහි සහ රටෙහි වෙනත් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් විසිනි.

මෙම සම්පූර්ණ යෝජනා ක්‍රමය පදනම්වී ඇත්තේ විද්‍යා උපුටා දැක්වීමේ සූචිය මතය (SCI). SCI යනු, විද්‍යාව මත ඇති කෙරෙන බලපෑම සහ උසස් තත්ත්වය හා අදාලව ලෝකයේ ඉහළම තත්ත්වයෙහි ලා සැලකෙන විද්‍යාත්මක සඟරාවන්හී දත්ත ගබඩාවයි. මෙලෙස SCI විසින් වර්ෂයකදී ලිපි 12,000,000ක් පමණ අඩංගු ලෝකයේ සඟරා 3700ක් පමණ විශ්ලේෂණයට ලක් කෙරේ.

සමාජ විද්‍යාව හැරුණුකොට අනෙකුත් සියළුම "සංකීර්ණ" විද්‍යා තේමාවන් පර්යේෂණ සම්මාන ප්‍රදාන යෝජනා ක්‍රමය මඟින් ආවරණය කෙරෙන අතර විද්‍යා උපුටා දැක්වීමේ සූචියෙහි දක්වා ඇති ශ්‍රී ලාංකික ලිපිනයක් සහිත කතුවරයෙකු විය යුතුය. කවුන්සිලය මඟින් මෙම නිර්ණායකයන් තුලට SCORPUS ඇතුලත් කිරීම හරහා මෙම නිර්ණායකය වෙනස් කිරීමකට ලක් කරනු ඇති අතර ඉදිරියේදී පවත්වනු ලබන සම්මාන උළෙලවලදී දැනට පවතින ප්‍රමිතීන් වැඩිදියුණු කෙරෙනු ඇත.

2013 වර්ෂය වන විට මෙම වැඩසටහන යටතේ 1999 සිට 2006 දක්වා SCIහී ලැයිස්තුගතකොට ඇති ප්‍රකාශනයන් ආවරණය කරමින්, වැඩසටහන් කිහිපයක් සම්පූර්ණ කරන ලදී. 2010 ජූලි 27 දින අරලියගහ මන්දිරයේදී අවසන් වරට පවත්වනු ලැබූ වැඩසටහනේදී, ශ්‍රී ලංකා ජනාධිපතිතුමන් විසින් 2003 – 2006 යන වර්ෂයන් සඳහා විද්‍යාඥයින් 383දෙනෙකුහට සම්මාන ප්‍රදානය කෙරිණි. 2013 වසර අවසාන වන විට 2007, 2008 සහ 2009 ප්‍රකාශනයන් සඳහා සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීමට දින නියම කරගනු ලැබිණි.

**රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන**

ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත්වීමේ අරමුණ සපුරාගැනීමේදී ඒ සඳහා අපේක්ෂා කෙරෙන ආර්ථික සංවර්ධනයෙහි අත්‍යාවශ්‍ය කොටසක් වන, ගෝලීය වෙළඳපළ තුල තරඟකාරීත්වයෙන් යුතු වටිනාකම් එක් කළ නිෂ්පාදන හා සේවාවන් වැඩිදියුණු කිරීමට විද්‍යා හා

තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් මහත් සේ ඉවහල් වනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, ශ්‍රී ලංකාව තුල සිදු කෙරෙන පර්යේෂණ, ආර්ථිකයේ ප්‍රගමනයට ඉවහල් වන රටෙහි ප්‍රධාන කර්මාන්තයන්හී අවශ්‍යතාවන් සපුරාලන ඉල්ලීම් මත පදනම් වූ පර්යේෂණ විය යුතුය.

රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන - පෞද්ගලික කර්මාන්ත - සහයෝගීතා (PPP) වැඩසටහන මඟින්, රටෙහි ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකත්වයක් ලබා දෙන පරිදි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ කර්මාන්තයන්හී ප්‍රධාන හවුල්කරුවන් සම්බන්ධ කිරීම සිදු කෙරේ. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් ප්‍රවර්ධනය තුලින් අපනයන භාණ්ඩ ඉහළ නැංවීම, අපනයන භාණ්ඩ විවිධාංගීකරණය සහ ආනයන ආදේශක ප්‍රවර්ධනය යනාදිය හරහා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමේ හැකියාව පවතී. නව්‍ය හෝ වඩා හොඳ තත්ත්වයේ නිෂ්පාදන, ක්‍රියාවලි, සේවාවන්, වටිනාකම් එක්කිරීම්, වාණිජමය හැකියාවන් සහිත තාක්ෂණික ගැටළු විසඳීම යනාදිය කෙරෙහි යොමුවූ නවෝත්පාදක පර්යේෂණයන් මෙම වැඩසටහන සඳහා සලකා බැලෙනු ඇත. විවිධ අංශයන් අතර ඇති කරගනු ලබන සහයෝගීතාවයන් තුලින් කර්මාන්තමය පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විසඳුම් සොයාගනු පිණිස අපගේ පර්යේෂණ විශේෂඥ ඥාණය, වියදම්, සේවාවන් සහ පහසුකම් වඩා ඵලදායී අයුරින් බෙදාහදා ගැනීමට හැකියාව ලැබේ.

මෙම සහයෝගීතාවයන් හරහා රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හී කාර්යක්ෂමතාවය වැඩිදියුණු කෙරෙනු ඇති අතර ඒ සඳහා ගතවන කාලයද අවම වනු ඇත. රාජ්‍ය අංශයේ සහයෝගීතාවය සහිත ව්‍යාපාරයක් මඟින් දරනු ලැබූ පර්යේෂණ හා සංවර්ධන වියදම් හා අදාලව බදු සහන ලබාදීම හරහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිගැන්වේ. ජාතික අවශ්‍යතාවයන් සඳහා පර්යේෂණ මත පදනම් වූ විසඳුම් ලබාදීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් රජය - දේශීය ආයතන - අමාත්‍යාංශ - විශ්වවිද්‍යාල - පර්යේෂණ හා සංවර්ධන ආයතන - පෞද්ගලික අංශය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය යන අංශයන් හා කටයුතු කෙරේ.

2012 වසරේදී රාජ්‍ය, පෞද්ගලික සහයෝගීතා වැඩසටහන ආරම්භ කරනු ලැබූ අතර එය මනා ලෙස සංවිධිත කරනු ලැබීමට ප්‍රථම අවම වශයෙන් චක්‍රයන් එකක් හෝ දෙකක් ක්‍රියාත්මක විය යුතුය.

**ඉලක්කගත බහු-විෂයයික පර්යේෂණ ව්‍යාපෘති**

ප්‍රතිපත්තියක් ලෙස සංවර්ධනය වෙමින් පවතින රටවල, හිඟ අභ්‍යන්තර භෞතික කුසලතා වලින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් නාස්තිකාරි ප්‍රයත්නයන් හා ප්‍රයත්නයන් යලි යලිත් සිදුවීම වලක්වාලීමටත් සෑම උත්සාහයක්ම  යුතුය. ආර්ථික හා සමාජ ප්‍රතිලාභ උපරිම ලෙස ලබාගත හැකි පරිදි පර්යේෂණ අරමුණුගත විය යුතුය. හුදකලා පර්යේෂණ මගින් සංකීර්ණ ගැටලු විසඳීමටත් ඒවා පිළිබඳ අවබෝධය වැඩි දියුණුකිරීමට හැකිවන්නේ කලාතුරකිනි. සරල සහයොගිතාව තුලින් විවිධ ක්ෂේත්‍රයන් හි කටයුතු කරන පර්යේෂකයහට බොහෝ දේ ඉටුකිරීමට එක්ව කටයුතු කළ හැක. බහුවිෂයයික ප්‍රවේශයක දී සාමාන්‍ය සීමාවන් ගෙන් බැහැර වූ  මානයන්ගෙන් ගැටලු ප්‍රතිඅර්ථගැන්වීමෙන් විසඳුම් ලබාගැනීම සඳහා විවිධ විශයන්ට සුදුසු පරිදි සකස් කිරීමත් ඒ සඳහා සුවිශාල හා දුෂ්කර ප්‍රශ්න  සඳහා විසඳුම් නව්‍ය ප්‍රවේශයකින් අවබෝධ කර ගැනීමත් සිදුවේ. බහුවිෂයයික කණ්ඩායම් පිහිටුවීම නවීන ජෛව වෛද්‍ය පර්යේෂණ කිරීමට ඉතා වැදගත් වන අතර විද්‍යාත්මක සොයාගැනීම් වල සංවර්ධනයට මෙන්ම, ප්‍රයෝජනවත් භාවිතයක් බවට එම සොයාගැනීම් පරිවර්තනය කිරීමට ද හේතුවෙයි.

ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදානයන් ලබාදීමේ ප්‍රතිපත්තිය සංශෝධනය කර තිබෙන අතර, 2014 සිට ප්‍රධාන  දිශානතිය ලෙස ඉලක්කගත බහු-විෂයයික පර්යේෂණ ව්‍යාපෘති හඳුනාගෙන ඇත. සෑම වසරකම රටේ ආර්ථික සංවර්ධනය, සමාජ සුභ සාධනය හා පාරිසරික තිරස්ථීතිය ඉලක්ක කරගත්

පර්යේෂණ සඳහා වන පූර්ව යෝජනාවන් විද්‍යාත්මක පර්යේෂණ සහ සංවර්ධන සංවිධාන හා විශ්ව විද්‍යාලවල පර්යේෂකයන් කණ්ඩායම් වලින් විභව්‍ය ඉලක්කගත බහු-විෂයයයික පර්යේෂණ ව්‍යාපෘති සඳහා කැඳවනු ඇත. වසර 5 ක කාලයක් සඳහා ලබාදෙන ප්‍රදානයක වටිනාකම රු. මිලියන 50 ක් වනු ඇත. ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය වාර්තාව මත පදනම්ව යෝජනාවන් කැඳවීම ප්‍රමුඛත්ව විෂය ක්ෂේත්‍රයන් ගෙන් සිදුකරනු කරනු ඇත.

ජාතික පර්යේෂණ සභාව ලෙස මහජන මුදල් සැලකිය යුතු ප්‍රමාණයක් මෙම ව්‍යාපෘති වලට ආයෝජනය කරන නිසා එය ඉතා තරගකාරී පදනමක් මත සිදුකරනු ලබයි. කණ්ඩායමක් ලෙස එකට එක්ව කටයුතු කළ හැකි වූ ඉතාම සුදුසු හා දක්ෂ පර්යේෂකයන් තෝරා ගැනීමෙන් වසර 5ක් තුළ දැනෙන ප්‍රතිඵල අත් කර ගත හැකි බව සලකන ව්‍යාපෘති ජාතික පර්යේෂණ සභාව මගින් තෝරාගැනීමට පරීක්ෂාකාරී වන්නෙමු.

**වෙනත් වැඩසටහන්**

පර්යේෂණ විද්‍යාගාරයන් වැඩිදියුණු කිරීම - ජාතික පර්යේෂණ සභාවෙහි පර්යේෂණ ප්‍රදාන වැඩසටහන හරහා වටිනාකමින් වැඩි, විශේෂිත උපකරණ පර්යේෂණ විද්‍යාගාර වෙත සපයා දී ඇත. සහයෝගීතා පර්යේෂණ වැඩසටහන මඟින් එවැනි උපකරණයන්හී භාවිතය සඳහා පහසුකම් සලසා දේ.

මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන - තම පර්යේෂණයන් විද්‍යාඥයින් විසින් සමාලෝචනය කෙරෙනු ලබන සඟරාවන්හී පළකිරීම සඳහා ප්‍රදානලාභීන් දිරිගන්වනු ලැබේ. ඒ අතරම විද්‍යාඥයින් විසින් සිදු කරනු ලබන පර්යේෂණයන් පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම අරමුණු කරගනිමින් සිය සොයාගැනීම් පුවත්පත්වල පළකිරීම සඳහා විද්‍යාඥයින්ට පහසුකම් සලසා දීම ජාතික පර්යේෂණ සභාව විසින් සිදු කෙරේ.

# ජාතික පර්යේෂණ සභාවේ අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන

2014 වර්ෂය ආරම්භ වූයේ ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන සහ ආචාර්ය උපාධි පුහුණු වැඩසටහන සඳහා පුවත් පත් දැන්වීමක් පළකිරීම හරහා අයැදුම්පත් කැඳවීමෙනි. මෙම දැන්වීම සියළුම විශ්වවිද්‍යාල පීඨයන් පර්යේෂණ හා සංවර්ධන ආයතන අතර බෙදාහරින ලදී.

බහුවිෂයානුබද්ධ ප්‍රවේශයන් සහිත කණ්ඩායම් පර්යේෂණ, සහයෝගීත්ව පර්යේෂණ යනාදිය සඳහා අඛණ්ඩව ප්‍රමුඛතාවය ලබාදෙන ලදී. 2013 පෙබරවාරි 28 දින අයැදුම්පත් භාරගැනීමේ කාලය නිමාවට පත්වූ අතර අයැදුම්පත් 169ක් ලැබී තිබුණි.

පළමු කාර්තුව තුලදී දැනට ක්‍රියාත්මක ප්‍රදානයන්ගේ වාර්ෂික ප්‍රගති වාර්තාවන් ඇගයීම් සඳහා යවන ලදී. මේ අතර ප්‍රදානයන් 15ක් මූල්‍යනය කෙරිණි.

මෙම ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුමකින් යුතු ඇගැයීම්කරුවන් වෙත මෙම අයැදුම්පත් (2013) යවනු ලැබිණි. ජුනි 17 සහ 18 දින රැස්වූ කවුන්සිලය විසින් තවදුරටත් මෙම අයැදුම්පත් පරීක්ෂාවට ලක්කොට ඉහළ මට්ටමේ විද්‍යාත්මක කුසලතාවයක් සහ ජාතික අදාලත්වයක් පෙන්නුම් කෙරෙන අයැදුම්පත්, ප්‍රදානය සඳහා තෝරාගනු ලැබිණි.

| ක්‍රියාකාරකම් | 2011 | 2012 | 2013 |
|---|---|---|---|
| ඇගයීමෙන් පසු මූල්‍යනය සඳහා තෝරාගත් අයදුම්පත් සංඛ්‍යාව | 79 | 61 | 28 |
| මූල්‍යයනය කරනු ලැබූ ප්‍රදාන සංඛ්‍යාව | 51 | 58 | 26+15* |
| ප්‍රදානය කරනු ලැබූ ආචාර්ය උපාධි / දර්ශනපති අධිශිෂ්‍යත්ව සංඛ්‍යාව | 67 | 56 | 36 |
| ආරම්භ කරනු ලැබූ සහයෝගීතාවයන් සංඛ්‍යාව | 76 | 45 | 78 |
| ප්‍රදානය කරනු ලැබූ ප්‍රදානයන්ගේ මුළු වටිනාකම | රු. මි 213 | රු. මි 220 | රු. මි 183 |
| නැවත ඉදිරිපත් කිරීම සඳහා යොමුකරන ලද අයැදුම්පත් සංඛ්‍යාව | | 32 | 6 |
| ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව | | 55 | 129 |
| අනාගත ඇගයීම් සඳහා තබාගත් අයදුම්පත් සංඛ්‍යාව | | 5 | - |
| PPP වෙත යොමුකරනු ලැබූ අයදුම්පත් සංඛ්‍යාව | | 2 | 6 |

ඉදිරිපත් කරනු ලැබූ අයැදුම්පත් අතරින් 16%ක් පමණක් තෝරාගනු ලැබිණි. තෝරාගනු ලැබූ අයැදුම්පත් මූල්‍යනය සඳහා මහාභාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී.

මෙම වසර තුලදී පර්යේෂණ ප්‍රදාන 26ක් මූල්‍යනය කරනු ලැබූ අතර නෛතික සහ බැංකු ලේඛන සකස් කරන ලදී. පසුව ප්‍රදාන ගිණුම් විවෘත කරනු ලැබිණි. නෛතික ලේඛන සඳහා අත්සන් තබනු ලැබූ දිනයේදී, ප්‍රදානලාභීන් සියළුදෙනා හා සභාපතිවරයා සමඟ හමුවක් පැවැත්විණි. ජාතික පර්යේෂණ සභාවෙහි ප්‍රදානයන් ක්‍රියාත්මක කෙරෙන ආකාරය පිළිබඳ සියළුම ප්‍රදානලාභීන් සඳහා කෙටි හඳුන්වාදීමක් සිදුකෙරිණි.

මෙම කාල පරිච්ඡේදය තුලදී ආචාර්ය උපාධි / දර්ශනපති උපාධි සිසුන් 26දෙනෙක් ලියාපදිංචි විය. සිසුන් වෙතින් අදාල සියළු ලේඛනයන් ඉල්ලා සිටින ලදී.

## Funded Research Grants 2013

| Grant No | Principal Investigator & Institution | Project Title |
|---|---|---|
| 11-64 | Dr. S.N. Surendran<br>University of Jaffna | Morphological and molecular characterization and Phylogenetic analysis of sandflies of the genus Sergentomyia (Diptera: Psychodidae) in relation to leishmaniasis transmission in Sri Lanka |
| 12-012 | Prof. K. Seneviratne<br>University of Kelaniya | Development of Commercially important natural antioxidant preperations based on coconut cake to stabilise and improve the nutritional quality |

| Grant No | Principal Investigator & Institution | Project Title |
|---|---|---|
| 12-020 | Dr. P. N. Ranasinghe<br>Geological Survey and mines Bureau | Exploring winter monsoon variability using marine and terrestrial proxies |
| 12-038 | Prof. R. Premaratne<br>University of Kelaniya | Effect of single dose intravenous methyl prednisolone in adult patients who develop serve dengue during febrile phase, a double blind placebo control trial |
| 12-086 | Dr. J. Manatunge<br>University of Moratuwa | Sustainable solutions to problems encountered in treatment and management of oil and grease from food industry, hotel and restaurant wastewater |
| 12-100 | Dr. R. Samarasekera<br>Industrial Technology Institute | Validation and Value Addition of Bio-active Natural Ingredients for Industrial Applications |
| 12-102 | Prof. R. L. R. Chandrajith<br>University of Peradeniya | Chemico-geography of selenium and its impact on food chain quality and animal health in Sri Lanka |
| 12-106 | Dr. H. M. A. Sominanda<br>University of Peradeniya | Immunopathological characterization of multiple sclerosis in Sri Lanka |
| 12-113 | Dr. P. M. P. C. G. Bandaranayake<br>University of Peradeniya | Molecular and biochemical characterization of Sri Lankan pomegranates and expression analysis of major hydrolyzable tannin genes under different environmental conditions and maturity stages to popularize cultivation in Sri Lanka |
| 12-116 | Dr. S. K. Weragoda<br>National Water Supply and Drainage Board | Comparative Analysis of Disinfection By-Products Formation Mechanism with other Water Quality Parameters to Minimize the Health Effect |
| 12-121 | D. M. D. Yakandawala<br>University of Peradeniya | Chromosome evolution of the endemic species of Sri Lanka with emphasis on families Anacardiaceae, Ebenaceae, Orchidaceae and Zingiberaceace |
| 12-130 | Prof. R. Weerasooriya<br>University of Peradeniya | Development of Unit Process for Chemical Removal of Nitrate from Drinking Water |
| 12-140 | Prof. J. Perera<br>University of Colombo | Genetic mutations responsible for isoniazid (INAH) resistance in Mycobacterium tuberculosis, Development of a rapid molecular method for detection of INAH resistance and study of molecular epidemiology of INAH resistant strains of |

| Grant No | Principal Investigator & Institution | Project Title |
|---|---|---|
| | | M. tuberculosis in Sri Lanka |
| 12-003 | Prof. K. Abewickrema<br>University of Kelaniya | Improvement of the post harvest storage life of banana using novel strategies and technology transfer to banana industry |
| 12-054 | Dr. N. S. Weerakkody<br>Open University of Sri Lanka | Application of extracts from selected spices, herbs and medicinal plants to reduce cross contamination of food borne bacteria and to extend the shelf life of ready to cook marinated chicken meat |
| 13-16 | Dr. S. K. Gunathilke<br>Sabaragamuwa University of Sri Lanka | Removal of Toxic Metals from Industrial Wastewater Using Agro-based waste products- A laboratory simulated study |
| 13-31 | Dr. L. Perera<br>Coconut Research Institute | Determination of the etiology of tapering disorder of coconut (Cocosnucifera L.) and molecular characterization of the causal agent |
| 13-32 | Dr. C. S. Ranasinghe<br>Coconut Research Institute | Determination of the effects of heat and water stress on fertility of female and male reproductive organs of coconut (Cocosnucifera L.) |
| 13-33 | Dr. Senani Williams<br>University of Kelaniya | Baseline assessment of micronuclei formation and chromosomal aberration as an index of exposure to natural radiation in the Sri Lankan population |
| 13-42 | Dr. R. Hanwella<br>University of Colombo | Baseline assessment of micronuclei formation and chromosomal aberration as an index of exposure to natural radiation in the Sri Lankan population |
| 13-50 | Dr. C. N. R. A. Alles<br>University of Peradeniya | Feasibility study of herbal plant extracts in increasing bone formation and reducing bone resorption in both in vitro and in vivo |
| 13-56 | Dr. R. S. Lokupitiya<br>University of Sri Jayewardenepura | Estimation of carbon fluxes for the South Asian region using Maximum Likelihood Ensemble Filter (MLEF) |
| 13-62 | Dr. S. M. W. Ranwala<br>University of Colombo | Effect of endocrine distrupturing fungicide "Mancozeb" (metal ethylene-bis-dithiocarbamate) on human endometrial receptivity and fertility |

| Grant No | Principal Investigator & Institution | Project Title |
|---|---|---|
| 13-87 | Dr. M. C. M. Iqbal<br>Institute of Fundamental Studies | Development of natural adsorbents for heavy metal and textile dye contaminated waste water treatment |
| 13-88 | Dr. R. A. U. J. Marapana<br>University of Sri Jayewardenepura | Assessment of pesticide residues and heavy metals in water, vegetables and milk in NuwaraEliya district and development of mitigation techniques to minimize health hazards caused by these xenobiotics |
| 13-95 | Dr. H. M. T. Herath<br>Industrial Technology Institute | Production of Glucose Syrup and High Protein concentrates from locally available raw materials of broken rice, maize and manioc |
| 13-105 | Dr. R. C. Siriwardena<br>University of Kelaniya | Biological analysis of angiogenesis tumour proliferation and tumour necrosis in hepatocellular carcinoma after trans-arterial therapy |
| 13-108 | Prof. R. W. Jayasekera<br>University of Colombo | Genetic risk alleles for ulcerative colitis among a Sri Lankan case-control panel |
| 13-109 | Dr. R. M. K. U. Rajapaksha<br>University of Moratuwa | An evidence based model for near carbon neutral non-domestic buildings in warm humid climates |
| 13-115 | Dr. Shehan Williams<br>University of Kelaniya | A randomised controlled trial investigating the effectiveness of cognitive behavior group therapy compared to a wait list control in the treatment of university students with social phobia |
| 13-121 | Prof. V. Arasaratnam<br>University of Jaffna | A study on Malnutrition and Associated factors among children aged1 to 5 years in Jaffna District |
| 13-122 | Prof. V. Arasaratnam<br>University of Jaffna | A study on Prevalence, Demographic, Socio-economic and Associated factors of Diabetes mellitus and metabolic syndrome among adults in Jaffna district |
| 13-130 | Prof. P. V. Udagama<br>University of Colombo | High Risk Human PapillomaViral infections & the risk of developing oraland pharyngeal cancer: Immuno and Molecular epidemiologic evidence from Sri Lanka |
| 13-134 | Dr. L. D. Rajasooriyar<br>University of Jaffna | Risk of saline groundwater in the Pungudutivu Island of the Jaffna Peninsula and measures for improving groundwater quality enabling sustainable utilization of the resource |

| Grant No | Principal Investigator & Institution | Project Title |
|---|---|---|
| | | |
| 13-145 | Prof. R. N. Jinadasa<br>University of Peradeniya | Comparative antimicrobial resistance patterns and genotypes of Escherichia coli isolates associated with acute diarrhea in humans, healthy poultry and retail chicken products in a selected area of Sri Lanka |
| 13-152 | Dr. B. S. M. S. Siriwardana<br>University of Peradeniya | Anaysis of the significance of invasive front characteristics in relation to prognosis of oral squamous cell carcinoma |
| 13-156 | Dr. C. M. B. Dematawewa<br>University of Peradeniya | Effect of hydrological regimes on fish yield and livelihood of fishing communities of Victoria reservoir and implications for management |
| 13-158 | Dr. N. P. Ranatunge<br>University of Ruhuna | Utilization of microbial antagonism in controlling anthracnose diseasein chilly |
| 13-159 | Dr. C. S. Herath<br>Coconut Research Institute | Assess the possibility of reducing fertilizer subsidy by enhancing otherinfluential factors |
| 13-160 | Dr. J. M. C. K. Jayawardana<br>Sabaragamuwa University of Sri Lanka | Evaluation of water quality and macro invertebrate compositon in relation to catchment land use practices in Umav Oya and BaduluOya sub catchments in Upper Mahaweli Cachment Area (UMCA) in Sri Lanka |
| 13-164 | Dr. E. Lokupitiya<br>University of Colombo | Strengthening of Capacity and assessment of life cycle carbon footprint of main agricultural export products of Sri Lanka in relation to climate change |

# විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ වැඩසටහන

මෙම වසර තුළදී 2006, 2007 සහ 2009 යන වර්ෂයන් ආවරණය කරමින් සම්මාන ප්‍රදානෝත්සවය පැවැත්වීම සඳහා දිනයක් තෝරාගනු ලැබූ අතර මෙම කාලසීමාව තුළදී එම උළෙල සඳහා සූදානම් වීම අඛණ්ඩව සිදු කෙරිණි.

# රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන

මෙම කාලසීමාව තුලදී රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. එහි ප්‍රගතිය පහතින් දක්වා ඇත.

| ක්‍රියාකාරකම් | 2012 | 2013 |
|---|---|---|
| රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවය සඳහා ලද EOI සංඛ්‍යාව | 59 | 14 |
| විස්තරාත්මක යෝජනාවන් ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් EOI සංඛ්‍යාව | 17 | 6 |

**දැනට ක්‍රියාත්මකව පවතින රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවයන්**

| පර්යේෂණ සහකරු | ව්‍යාපෘති නාමය |
|---|---|
| ආචාර්ය අනිල් ගුණතිලක<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | Locally developed respiratory care products |
| ආර්.එම්. ධර්මදාස<br>කාර්මික තාක්ෂණ ආයතනය | Formulation of a Para- pheromone from local varieties of Ocimum sanctum for the control of fruit and melon flies |
| ආචාර්ය ආර්.එම්.සී. දේශප්‍රිය<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය | Determination and validation of optimum time - temperature combinations for HTST pasteurization and ultra high temperature treatment of milk to assure food safety, extended shelf life, preservation of natural sensory qualities and minimum loss of nutrients during routine manufacture of liquid milk products in Sri Lanka at lowest energy cost |
| ආචාර්ය එස්.එම්.සී.යූ.පී. සුබසිංහ<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | Variation of naturally and artificially induced agarwood resin content and quality of Gyrinopswalla for commercial extraction and its nursery establishment |

# ඉලක්කගත බහු-විෂයයයික පර්යේෂණ ව්‍යාපෘති

කර්මාන්ත හා රාජ්‍ය පර්යේෂකයන් සමඟ බුද්ධිමය කතිකාවත් සැසි හා සාකච්ඡාවන් කිහිපයක් පැවැත්වීමෙන් අනතුරුව සභාව මගින් වැඩසටහන පෙලගැස්ම සූදානම් කරන ලදී.

2013 වසර අවසන් කාර්තුවේ දී, රාජ්‍ය විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන සංවිධානවල හා විශ්ව විද්‍යාලවල පර්යේෂකයන් කණ්ඩායම් වලින් විභව්‍ය මූල්‍යයනයන් සඳහා පූර්ව යෝජනාවන් කැඳවන ලද අතර සභාව මගින් එම පූර්ව යොජනාවන් ඇගයීම සිදුකෙරිණි. ඇගයීමෙන් අනතුරුව තෝරාගත් ව්‍යාපෘති මගින් විස්තරාත්මක යෝජනාවන් කැඳවන ලදී. තවදුරටත් කටයුතු ඊළඟ වසරේ දී සිදුකිරීමට නියමිතව ඇත.

# මාධ්‍ය සහ සංවර්ධන වැඩසටහන

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා අයඩීන් ඌනතාවය පිළිබඳ සහ පූර්ව ප්‍රසව මන්දතයිරොයිඩතාවය පිළිබඳ දැනුම වර්ධනය කරවීමේ වැඩසටහනක් අම්පාර මහ රෝහලේදී පැවැත්විණි.

රුහුණු විශ්වවිද්‍යාලය සහ අම්පාර මහ රෝහලේ සහයෝගීතාවයෙන් 2013 ජනවාරි 02 දින මෙම වැඩසටහන පවත්වන ලදී. මෙම වැඩසටහනෙන් අනතුරුව, අම්පාර මහ රෝහලේදී පූර්ව ප්‍රසව මන්දතයිරොයිඩතාවය සඳහා අළුත උපන් බිළිඳුන් පරීක්ෂාවට ලක්කිරීම සඳහා දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.

#### දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය 2013 - අම්පාර

2013 මාර්තු මසදී අම්පාරේදී පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශනය සඳහා ජාතික පර්යේෂණ සභාව සහභාගී වූ අතර, ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන සහ මහජනතාව සඳහා සභාවෙන් ඉටුවන කාර්යභාරය පිළිබඳ ප්‍රදර්ශන කුටියෙන් නිරූපනය කෙරිණි. මහාචාර්ය ආර්.පී.වී.ජේ. රාජපක්ෂ (ජා:ප:ස: ප්‍රදාන 09 – 05), පේරාදෙණිය විශ්වවිද්‍යාලය ඉංජිනේරු (ආචාර්ය) සුධීර ද සිල්වා (ජා:ප:ස: ප්‍රදාන 11 – 193), සිවිල් සහ පාරිසරික ඉංජිනේරු විද්‍යා අංශය, ඉංජිනේරු පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය යන අයගේ පර්යේෂණ ක්‍රියාකාරකම් සහ වෙනත් ප්‍රදාන ව්‍යාපෘති කිහිපයක් සඳහා මෙහිදී ප්‍රමුඛතාවය ලබාදෙන ලදී.

#### පුවත්පත්හී පළවූ නව ලිපි

පර්යේෂණ ප්‍රදාන සහ අනෙකුත් ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන් පිළිබඳ දැනුම්වත් වීමද, ජාතික පර්යේෂණ සභාවේ සංවර්ධන ක්‍රියාකාරකම්හී එක් අංගයකි. මෙම කාලච්ඡේදය තුලදී ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රවෘත්ති පත්‍රයන්හී පළවූ ලිපි සමහරක් පහතින් දක්වා ඇත.

| අංකය | දිනය | ප්‍රවෘත්ති පත්‍රය | ලිපියේ මාතෘකාව |
|---|---|---|---|
| 1 | 2013.04.28 | Sunday Times | The Butterfly effect |
| 2 | 2013.04.26 | The Sunday Times | The Complexities of being a butterfly |
| 3 | 2013.04.29 | ලංකාදීප | බර ඉසිලීමේ ක්‍රීඩක වැරදි හඳුනා ගැනීම : පේරාදෙණි සරසවි පර්යේෂණයට සම්මානයක් |
| 4 | 2013.04.24 | මව්බිම | බර ඉසිලීමේ ක්‍රීඩාවේදී සිදුවන වැරදි නිවැරදිව හඳුනාගැනීමට ක්‍රමවේදයක් |
| 5 | 2013.04.25 | රිවිර | නේචර්ස් සීක්‍රට්ස් රටට වැඩ ඇති පර්යේෂකයන් අගයයි |
| 6 | 2013.05.01 | Daily News | Nature's Secrets presents "Research Award" |
| 7 | 2013.05.05 | දිවයින | නේචර්ස් සීක්‍රට්ස් පර්යේෂණ සම්මානය 2012 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නවතම සොයාගැනීමක් වෙනුවෙන් |
| 8 | 2013.06.02 | The Sunday Times | West Nile Virus making people ill here *Joint university identifies it as causing brain fever* |
| 9 | 2013.06.02 | රිවිර | *නිසරු නිසරු කරන පරපුරු ජාන වියරුවපියයුරු පිළිකා* කල්තියා හඳුනාගැනීමේ අලුත් ක්‍රමයක් |
| 10 | 2013.06.10 | ලංකාදීප | උතුරු ප්‍රදේශයේ පාංශු සම්පත් සිතියමට නැගෙයි. |

| අංකය | දිනය | ප්‍රවෘත්ති පත්‍රය | ලිපියේ මාතෘකාව |
|---|---|---|---|
| 11 | 2013.06.15 | ලංකාදීප | වන අලින්ගේ ගමන් මඟදැනගන්න ගණිතානුකූල මොඩලයක් |
| 12 | 2013.06.29 | ලංකාදීප | ගොඩනැගිලි-පාලම්-මහා මාර්ග තත්ව පරීක්ෂාවට නවීන තාක්ෂණයක් |
| 13 | 2013.07.06 | ලංකාදීප | අත් පා අහිමිවූවන්ට රොබෝ බාහු |
| 14 | 2013.07.23 | ලංකාදීප | කැළණි ගගේ ජලය දූෂ්‍ය වෙලාද? |
| 15 | 2013.07.20 | ලංකාදීප | අධිවේගී මහට නවීනආරක්ෂණ පද්ධතියක් |
| 16 | 2013.07.27 | ලංකාදීප | කොළ හකුලන දළඹුවා මර්දනයට බිත්තර පරපෝෂිත කෘමීන් |
| 17 | 2013.09.08 | රිවිර | චන්ද්‍රිකා සංඥා තාක්ෂණයෙන් දුම්රිය ගමන අලුත් වෙයි. |
| 18 | 2013.09.14 | ලංකාදීප | දුම්රිය ධාවනය කරවන්න ස්වයංක්‍රීය පද්ධතියක් |
| 19 | 2013.10.27 | Daily Mirror | New device to spot train locations |
| 20 | 2013.10.27 | The Sunday Times | Modern tech to optimise train movement |
| 21 | 2013.10.11 | අද | දුම්රිය පැමිණෙන වෙලාව නිවැරදිව දැනුම්දිය හැකි නව මෙහෙයුම්පද්‍ධතියක් |
| 22 | 2013.10.21 | ලංකාදීප | දුම්රිය පැමිණෙන වෙලාව මගීන්ට නිවැරදිව දැනුම්දිය හැකි නව මෙහෙයුම්පද්‍ධතියක් |
| 23 | 2013.10.19 | Daily Mirror | Timing train travel |
| 24 | 2013.08.17 | ලංකාදීප | මන්ද මානසික දරුවන් කලින් හඳුනාගන්න ක්‍රමයක් |
| 25 | 2013.08.17 | ලංකාදීප | නැනෝ තාක්ෂණයෙන් නව රබර් නිපැයුම් |
| 26 | 2013.08.31 | ලංකාදීප | ගින්නකදී, භූකම්පනයදී තොරතුරු සපයන රැහැන් රහිත සංවේදී ජාලකරණයක් |
| 27 | 2013.09.04 | ලංකාදීප | රබර් වගාවේ සුදුමුල් රෝගය මර්දනය කිරීම සඳහා නව පර්යේෂණ |
| 28 | 2013.09.11 | ලංකාදීප | ඵලදායීතාව නංවන්න ගුණාත්මක තේ සංරක්ෂණය කරයි. |
| 29 | 2013.09.21 | ලංකාදීප | කොළඹ විශ්ව විද්‍යාලයේ පර්යේෂණ කණ්ඩායමක් බේසල් පියයුරු පිළිකා හඳුනාගන්න හදයි. |
| 30 | 2013.09.24 | අද | අඩු පිරිවැයකින් වැඩි වී අස්වැන්නක් නෙළා ගන්න පේරාදෙණිය කෘෂිපර්යේෂණ කණ්ඩායමක් සැරසෙති. |
| 31 | 2013.09.25 | සිරිකත | මාසේ ගෑස් වියදම ඉතිරිකර ගන්න ගෙදර හදන බයෝ ගෑස් |
| 32 | 2013.09.28 | ලංකාදීප | කිනිතුල්ලන්ගේ රෝග වාහක හැකියාව අවම කරන්න පර්යේෂණ |
| 33 | 2013.10.12 | ලංකාදීප | ගෝලීය උණුසුමෙන් සමනලුන්ගේ ජාන වෙනස් වෙලාද? |
| 34 | 2013.10.07 | අද | පිටිමකුණන් මර්දනයට සරසවි පර්යේෂණ කණ්ඩායමක් |
| 35 | 2013.10.14 | ලංකාදීප | අයඩින් නැතුවම බැරිද? |
| 36 | 2013.10.18 | අද | කුකර්බිටවේසි කුලයට අයත් ශාකවල දිලීර රෝග පාලනයට සිලිකා රසායනිකය |
| 37 | 2013.10.19 | ලංකාදීප | ආමාශ පිළිකාවල දරුණුබව වැඩිකරන ප්‍රතිග්‍රාහක හඳුනාගනී. |
| 38 | 2013.10.25 | අද | 'තම්පලා' ආහාර සලාකයක් ලෙස ලබා දී එළුකිරි නිෂ්පාදනය වැඩිකරන්නපර්යේෂණ |
| 39 | 2013.10.30 | ලංකාදීප | අඩු පිරිවැයකින් වැඩි වී අස්වැන්නක් නෙළා ගන්න පේරාදෙණිය කෘෂිපර්යේෂණ කණ්ඩායමක් සැරසෙති. |
| 40 | 2013.11.15 | අද | නකල්ස් රක්ෂිතයේ මුඩු බිම් නැතිකරන්න දේශීය ශාක සංයෝජන අත්හදා බලයි |
| 41 | 2013.12.02 | අද | ඵලදායීතාව නංවන්න ගුණාත්මක තේ සංරක්ෂණය කරයි. |

| අංකය | දිනය | ප්‍රවෘත්ති පත්‍රය | ලිපියේ මාතෘකාව |
|---|---|---|---|
| 42 | 2013.12.16 | අද | අඩු පෝස්පේට් පොහොර යොදවා වැඩි වී අස්වැන්නක්ගන්න පර්යේෂණ |
| 43 | 2013.12.21 | ලංකාදීප | ලංකාවේ මුහුදු ඉකිරි සොයයි. |

# අවසාන ගිණුම් 2013


2013 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන

මූල්‍යමය කාර්යසාධන ප්‍රකාශනය 25

මූල්‍යමය තත්වය පිළිබඳ ප්‍රකාශනය 26

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 27

ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය 28

මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන් 29

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**

**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍යයමය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2013<br>රු. | 2012 (ගලපන ලද)<br>රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| පුනරාවර්තන ලැබීම් - ජාතික පර්යේෂණ සභා පරිපාලනය | ***3.09ආ*** | 9,867,000.00 | 9,189,900.00 |
| පුනරාවර්තන ලැබීම් - පර්යේෂණ හා සංවර්ධන | ***3.09ඇ*** | 145,865,650.50 | 69,532,415.75 |
| වෙනත් ලැබීම් | | 673,000.00 | 632,392.40 |
| **මුළු ආදායම** | | **156,405,650.50** | **79,354,708.15** |
| **වියදම්** | | | |
| පුද්ගල වේතන | | 6,155,020.34 | 3,686,321.78 |
| පර්යේෂණ හා සංවර්ධන | ***3.09ඇ*** | 116,822,400.19 | 47,713,220.42 |
| සැපයුම් හා නම්‍ය ද්‍රව්‍ය | | 1,829,320.58 | 1,481,809.86 |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් - ජාතික පර්යේෂණ සභා ප්‍රදාන | **3.8** | 29,043,250.31 | 21,819,195.33 |
| ක්ෂය - ජාතික පර්යේෂණ සභා කාර්යාල උපකරණ | **3.8** | 609,577.85 | 441,829.55 |
| වෙනත් වියදම් | | 4,293,341.19 | 3,761,309.34 |
| මූල්‍ය පිරිවැය | | 10,500.00 | 8,000.00 |
| **මුළු වියදම** | | **158,763,410.46** | **78,911,686.28** |
| අතිරික්තයන් ආශ්‍රිතයන් සඳහා වෙන්කරන කොටස | | - | - |
| **කාලච්ඡේදයේ අතිරික්තය / (හිඟය)** | | **(2,357,759.96)** | **443,021.87** |
| වෙන් කළා: | | | |
| පාලන අස්තිත්වයේ හිමිකාරත්වයට | | (2,357,759.96) | **443,021.87** |
| සුළු කොටස්කරුවන් | | - | - |
| | | (2,357,759.96) | **443,021.87** |

***පිටු අංක 06 සිට 14 දක්වා ඇති සටහන්ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි.***

***වරහන් මඟින් අඩුවීම් දක්වා ඇත.***

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**

**2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළබඳ ප්‍රකාශය**

| | සටහන් | 2013<br>රු. | 2012 (ගලපන ලද)<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 3,539,852.86 | 3,583,250.75 |
| ලැබිය යුතු දෑ | | - | 150,896.00 |
| තොග | | | - |
| පූර්ව ගෙවීම් | 3.11 | 400,000.00 | 250,000.00 |
| ජාතික පර්යේෂණ සභා ප්‍රදාන | | 354,392,389.88 | 346,873,287.07 |
| ජා:ප:ස: රාජ්‍ය, පෞද්ගලික සහයෝගීතා වැඩසටහන | | 41,948,125.00 | |
| වෙනත් ජංගම වත්කම් | | | |
| | | **400,280,367.74** | **350,857,433.82** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ලැබිය යුතු දෑ | | | - |
| ආශ්‍රිතයන්ගේ ආයෝජන | | | - |
| වෙනත් මූල්‍ය වත්කම් | 3.10 | 480,000.00 | 480,000.00 |
| දේපළ පිරියත හා උපකරණ | 3.8 | 201,871,941.71 | 181,964,334.18 |
| ඉඩම් හා ගොඩනැගිලි | | | - |
| අස්පෘෂ්‍ය වත්කම් | | | - |
| වෙනත් මූල්‍යමය නොවන වත්කම් | | | - |
| | | **202,351,941.71** | **182,444,334.18** |
| **මුළු වත්කම්** | | **602,632,309.45** | **533,301,768.00** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 3.12 | 601,220.68 | 494,268.76 |
| | | **601,220.68** | **494,268.76** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | | | - |
| | | - | - |
| **මුළු වගකීම්** | | 601,220.68 | **494,268.76** |
| **ශුද්ධ වත්කම්** | | **602,031,088.77** | **532,807,499.24** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ප්‍රාග්ධනය සඳහා දායකත්වය; | | | |
| වෙනත් රාජ්‍ය ආයතන | | | - |
| සංචිත | | | - |
| සමුච්චිත අතිරික්තය / (හිඟය) | | 602,031,088.78 | 532,807,499.24 |
| සුළු කොටස් අයිතිය | | | - |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **602,031,088.78** | **532,807,499.24** |

***මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම සභාව සතුය.***

***සභාව වෙනුවෙන් අත්සන් තබන ලදී.***

…………………………..

**මහාචාර්ය එච්.ජේ. ද සිල්වා**

**සභාපති, ජාතික පර්යේෂණ සභාව**

**2014 අප්‍රේල් 04**

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013 | 2012 (ශලපන ලද) |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය** | | |
| **ලැබීම්** | | |
| බදු | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් (පුනරාවර්තන) | 9,867,000.00 | 9,189,900.00 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් (සංවර්ධන ආධාර) | 217,447,000.00 | 220,940,000.00 |
| භාණ්ඩ හා සේවා අලෙවියෙන් | | - |
| නිම කළ ප්‍රදානයන්ගෙන් ලැබීම් | 28,649,245.14 | 10,198,477.45 |
| පොලී ලැබීම් | | - |
| වෙනත් ලැබීම් | 673,000.00 | 632,392.40 |
| **ගෙවීම්** | | |
| සේවකයන් සඳහා මුදල් ගෙවීම් | (6,155,020.34) | (3,686,321.78) |
| විශ්‍රාම පාරිතෝෂික | | - |
| සැපයුම් | | - |
| පර්යේෂණ ප්‍රදාන හා වෙනත් වැඩසටහන් | (243,541,990.07) | (227,456,450.51) |
| පොලී ගෙවීම | | - |
| වෙනත් ගෙවීම් | (5,991,506.75) | (5,794,095.82) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **947,727.98** | **4,023,901.74** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම | (991,125.87) | (1,563,216.98) |
| පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබීම් | | - |
| ආයෝජන විකිණීමෙන් ලැබීම් | | - |
| විදේශ මුදල් සුරැකුම්පත් මිලදී ගැනීමට | | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(991,125.87)** | **(1,563,216.98)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වන මුදල් ප්‍රවාහය** | | |
| ණය ගැණුම් වෙනුවෙන් ලැබීම් | | - |
| ණය ගැණුම් ආපසු ගෙවීම් | | - |
| රජයට බෙදාහාරීම් / ලාභාංශ | | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය** | - | - |
| **මුදල් හා මුදල් සමාන දෑහී ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | (43,397.89) | 2,460,684.76 |
| **වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ** | 3,583,250.75 | 1,122,565.99 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **3,539,852.86** | **3,583,250.75** |

*පිටු අංක 06 සිට 14 දක්වා ඇති සටහන්ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි.*

*වරහන් මගින් අඩුවීම් දක්වා ඇත.*

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | සමුච්චිත අතිරික්තය හෝ හිඟය | එකතුව | මුළු ශුද්ධ වත්කම් / හිමිකම් |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය (ගලපන ලද)** | 532,807,499.24 | 532,807,499.24 | 532,807,499.24 |
| ආරම්භක ශේෂයට ගැලපීම | - | - | - |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම | - | - | - |
| | 532,807,499.24 | 532,807,499.24 | 532,807,499.24 |
| **2013 සඳහා ශුද්ධ වත්කම් / ස්කන්ධයේ වෙනස්වීම** | | | |
| දේපළ ප්‍රත්‍යාගණනයෙන් ලැබීම් | - | - | - |
| ආයතනයේ උපකරණ හුවමාරුවෙන් ලද මුදල | - | - | - |
| ආයෝජන ප්‍රත්‍යාගණන අලාභ | - | - | - |
| විදේශ මෙහෙයුම් හුවමාරු වෙනස්වීම් | - | - | - |
| ශුද්ධ වත්කම් / ස්කන්ධයෙහි සෘජුව හඳුනාගත් ආදායම (ශුද්ධ අගය) | 71,581,349.50 | 71,581,349.50 | 71,581,349.50 |
| කාලච්ඡේදයේ (හිඟය) / අතිරික්තය | (2,357,759.96) | (2,357,759.96) | (2,357,759.96) |
| **කාලච්ඡේදය සඳහා හඳුනාගත් මුළු ආදායම හා වියදම්වල වටිනාකම** | - | - | - |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය ඉදිරියට ගෙනගියා** | **602,031,088.78** | **602,031,088.78** | **602,031,088.78** |

*පිටු අංක 06 සිට 14 දක්වා ඇති සටහන්ද මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේම කොටසකි. වරහන් මඟින් අඩුවීම් දක්වා ඇත.*

# ජාතික පර්යේෂණ සභාව
# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. සංයුක්ත තොරතුරු

### 1.1 පොදු

ජාතික පර්යේෂණ සභාව (ජාපස) අංක 1514/28 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය යටතේ ජනාධිපති නියෝගයක් වන විශේෂ ආයතනයක් ලෙස පිහිටවුන ලැබ ඇත.

ජාතික පර්යේෂණ සභාව, කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 380/97 යන ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය ආයතනයකි.

මූල්‍ය ප්‍රකාශන දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයකට සකස්කොට ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්හී ස්වභාවය

අංක 1514/28 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය යටතේ ජනාධිපති නියෝගයක් මත ජාතික පර්යේෂණ සභාවෙහි කාර්යයන් දක්වා ඇත. සඳහන්කොට ඇති අරමුණු සපුරා ගැනීම සඳහා පහත දැක්වෙන ප්‍රධාන වැඩසටහන් මෙම වසර තුළදී ක්‍රියාත්මක කරන ලදී.

**පර්යේෂණ ප්‍රදාන සහ ආචාර්ය උපාධි වැඩසටහන**

- රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී පර්යේෂණයන් සහ පශ්චාත් උපාධි අධිශිෂ්‍යත්ව මූල්‍යනය කිරීම. මෙම වර්ෂය තුලදී මෙම වැඩසටහන "අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන" ලෙස එක් වැඩසටහනක් ලෙස ඒකාබද්ධ කෙරිණි.

**විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන**

- ශ්‍රී ලාංකීය පර්යේෂකයින් සහ පර්යේෂණ ආයතන සඳහා පිළිගැනීමක් ලබාදීම.

මෙම වසර තුලදී මෙම වැඩසටහනෙහි නාමය "විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන" ලෙස වෙනස් කරණු ලැබිණි.

**පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන**

- ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා පෞද්ගලික / රාජ්‍ය අංශයේ පර්යේෂණ අවශ්‍යතාවයන් මූල්‍යනය කිරීම.

පෞද්ගලික අංශයේ සහයෝගීතා වැඩසටහන හරහා පෞද්ගලික අංශයේ ආයෝජන සිදු කෙරෙන අතර මෙම වර්ෂය තුල රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘති 4ක් ක්‍රියාත්මකව පැවැත්විණි. ඒ අනුව, 2013 දෙසැම්බර් 31 දිනට මෙම පෞද්ගලික සහයෝගීතා ගිණුම්හී ශේෂයන් රු.3,944,113.07ක් විය.

**වෙනත් සංවර්ධන වැඩසටහන්**

- ජාතික පර්යේෂණ සභාවෙහි අරමුණු සපුරා ගැනීම සඳහා අවශ්‍ය වෙනත් වැඩසටහන්

**ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ සුවිශාල ව්‍යාපෘති වැඩසටහන**

සිය මූල්‍යයන ප්‍රතිපත්තීන් සංශෝධනය කිරීමට, ජාතික පර්යේෂණ සභාව ක්‍රියාකොට ඇති අතර ඒ යටතේ ඉලක්ක මත පදනම් වූ පර්යේෂණ ව්‍යාපෘතීන් මූල්‍යනය කිරීම සඳහා ප්‍රමුඛත්වය හිමිවනු ඇත. සෑම වර්ෂයකම, රාජ්‍ය විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හී සහ විශ්වවිද්‍යාලයන්හී පර්යේෂණ කණ්ඩායම් වෙතින්, රටෙහි ආර්ථික සංවර්ධනය, සමාජීය සුභසාධනය සහ පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින් ජාතික ගැටළු විසඳීම කෙරෙහි යොමු වූ ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන් මූල්‍යනය කිරීම සඳහා පූර්ව යෝජනා කැඳවනු ලැබේ. වසර 5ක කාලසීමාවක් තුල පිරිනැමෙන මෙම එක් ප්‍රදානයක වටිනාකම රු. මිලියන 50ක් දක්වා වනු ඇත. ජාතික විද්‍යා තාක්ෂණ ප්‍රතිපත්ති වාර්තාව හා අනුකූලත්වය දක්වමින් ප්‍රමුඛතා ක්ෂේත්‍ර කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ඇත.

### 1.3 නිකුත් කිරීම සඳහා අවසරය ලබාදීම

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික පර්යේෂණ සභාවෙහි මූල්‍ය ප්‍රකාශනයන් නිකුත් කිරීම සඳහා සභාවේ සාමාජික මණ්ඩලයේ අවසරය 2014 අප්‍රේල් 04 දින ලබා දෙන ලදී.

## 2. ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

### 2.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා පෞද්ගලික අංශයේ

## ජාතික පර්යේෂණ සභාව
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ගණකාධිකරණ ප්‍රතිපත්තීන් හා අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස්කොට ඇත.

### 2.1.1 අනුකූලතා ප්‍රකාශය

ජාතික පර්යේෂණ සභාවෙහි මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත්කොට ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS) හා අනුකූලව පිළියෙල කොට ඇත.

### 2.1.2 සැලකිලිමත්භාවය

ජාතික පර්යේෂණ සභාවට සිය ක්‍රියාකාරකම්හී අඛණ්ඩව නියැලීම සඳහා සම්පත් තිබීම පිළිබඳව ජාතික පර්යේෂණ සභාවේ කවුන්සිලය සෑහීමකට පත්වී ඇත. තවද, ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයක් පිළිබඳව කවුන්සිලය දැනුවත් වී නොමැත.

### 2.1.3 මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමට පිළිගත් ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව සකස්කර ඇති අතර මෙම ගිණුම් සඳහා බලපාන උද්ධමන සාධකයක් සඳහා කිසිදු ගැලපීමක් කර නැත.

### 2.1.4 මෙහෙයුම් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කරන අතර ජාතික පර්යේෂණ සභාවෙහි මෙහෙයුම් මුදල් ඒකකයද එය වේ.

සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර වෙනත් ලෙසකින් දක්වා නොමැත්තේ නම් ආසන්න සතයට දක්වනු ලැබේ.

### 2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයක්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

මූල්‍යමය තත්වය පිළිබඳ ප්‍රකාශනයන්හී නියෝජනය වී ඇති යම් යම් ධාරණ අගයන් මැනීමේදී සිදුකළ උපකල්පනයන් සහ ඇස්තමේන්තු සහ මූල්‍යමය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශනයෙහි ශාස්තු ප්‍රමාණයන් අනුව මූල්‍යමය ප්‍රකාශනයන් විචල්‍ය වේ. මූල්‍යමය ප්‍රකාශන සටහන්හී හෙළිකොට ඇති වත්කම් සහ බැරකම්හී ධාරණ අගයන් සඳහා ප්‍රමාණාත්මක ගැලපීම් සිදුවීමේ සැලකිය යුතු අන්දමේ අවදානමක් මෙමඟින් ප්‍රතිඵල වනු ඇත.

SLFRS ප්‍රමිතීන් හා අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සහ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් ලෙස වාර්තා කළ අගයන්ට බලපාන විවිධ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනය කිරීම සඳහා කළමනාකරණයන් අවශ්‍ය වේ.

විනිශ්චයන් හා ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් හා අවස්ථානුකූල සාධාරණ යැයි විශ්වාස කළ හැකි අපේක්ෂාවන් වැනි වෙනත් සාධක මත පදනම් වේ. එබැවින්, සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵලයන් මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලින් වෙනස් විය හැකිය.

### 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හී සාරාංශය

පහත දැක්වෙන සියළු ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂය හා සංගත වේ.

සමහර සංසංදනාත්මක තොරතුරු වර්තමාන වර්ෂයේ තොරතුරු හා ගැලපීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හිදී යලි වර්ගීකරණය කර ඇත.

### 3.1 විදේශ මුදල්

සියළු විදේශීය හුවමාරු ගණුදෙනු එම ගණුදෙනු සිදුවන දිනයේ පැවැති විනිමය අනුපාත අනුව මෙහෙයුම් මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ.

### 3.2 වත්කම් හා වත්කම් අගය කිරීමේ පදනම

වත්කම් වර්ගීකරණයේදී ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස දක්වනුයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය හෝ වාර්තාකරණ දින සිට වසර යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් කිරීම අපේක්ෂා කළ හැකි මුදල් හා බැංකු ශේෂයන්ය.

ජාතික පර්යේෂණ සභාව
**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්**

**3.2.1 දේපළ පිරියත හා උපකරණ**

**3.2.1.1 මූලික හඳුනාගැනීම**

දේපළ, පිරියත හා උපකරණ අයිතම පිරිවැයෙන් සම්මුචිත ක්ෂය අඩුකළ අගයට මනිනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට වත්කම් අත්පත් කරගැනීමට හෝ ඉදිකිරීමට සෘජුවම දරණ ලද අවස්ථානුකූල පිරිවැයන් සමඟ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය, යම් වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්වයට ගෙන ඒමට හා එම වත්කම් පිහිට වැඩබිමේ යලි ප්‍රතිෂ්ඨාපනයට හා ගලවා ඉවත් කිරීමේ පිරිවැය ඇතුලත් වේ. අදාල උපකරණයේ ක්‍රියාකාරීත්වයට මූලික වන මිලදී ගත් මෘදුකාංගයන්ද එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කෙරේ. යම් දේපළ, පිරියත හා උපකරණ කොටස් සඳහා විවිධ ඵලදායී ජීව කාලයක් පවතින විටදී ඒවා වෙනම දේපළ, පරියත හා උපකරණ අයිතම ලෙස ගිණුම් ගත කරයි.

ජාතික පර්යේසණ සභාවේ ප්‍රදාන මඟින් මිලදී ගන්නා දේපළ, පිරියත හා උපකරණ වත්කම් පවරාදෙන තෙක් හෝ ඉවත් කරන තෙක් ජාතික පර්යේසණ සභාවේ දේපළ, පිරියත හා උපකරණවල කොටසක් ලෙස තාවකාලිකව හඳුනා ගැනේ.

පහත 3.2.1.3 හි නියම කර ඇති පදනම මත සම්මුචිත ක්ෂය ගණනය කෙරේ.

**3.2.1.2. අනුරූප පිරිවැයන්**

කොටස තුලින් අනාගත ආර්ථික ප්‍රතිලාභ ජාතික පර්යේෂණ සභා/ ප්‍රදානයන්ට අපේක්ෂා කළ හැකි නම් හා එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි නම් එම අයිතමයේ ධාරණ අගයෙහි දේපළ, පිරියත හා උපකරණ අයිතමය යලි සවිකිරීමේ පිරිවැයෙහි කොටසක් ලෙස හඳුනාගනී. මේ සඳහා වියදම් පරීක්ෂා කිරීම් හා වෙන් වෙන්ව ගිණුම්ගත කිරීම ඇතුලත් වේ.

දේපළ, පිරියත හා උපකරණ දෛනික සේවා කිරීමේ පිරිවැය ලාභ හා අලාභයන්හිදී වියදමක් ලෙස හඳුනාගැනේ.

ආරම්භයේදී තක්සේරු කරනු ලැබූ කාර්ය සාධන මට්ටම මඟින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ප්‍රතිස්ථාපනය හෝ නඩත්තු කිරීම සඳහා දේපළ, පිරියත හා උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තු කිරීමේ ගාස්තු ඇතුලත් අනෙකුත් සියළු වියදම් ලෙස හඳුනාගැනේ.

**3.2.1.3 ක්ෂය**

ක්ෂය හඳුනාගනු ලබන්නේ ස්ථාවර වත්කම්හී පිරිවැය මත පදනම්ව ගණනය කරනු ලැබූ ලාභය හා අලාභය අනුවයි. මෙම පිරිවැයන් ඇස්තමේන්තු කරනු ලැබූ ඵලදායී ජීව කාලයක් පුරා කපාහැරීම සඳහා මෙලෙස සිදු කෙරේ.

වත්කම් ඒවා පරිහරණය සඳහා ලබාදුන් දිනයේ සිට ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පුරා සෘජු රේඛා පදනම මත ලාභ හා අලාභ අනුව හඳුනාගැනේ. වර්තමාන හා සංසන්දනාත්මක කාලච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලයක් හා ප්‍රතිශතයන් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| විවිධ වත්කම් | වසර 2 | 50.00 % |
| හැඳි ගැරුප්පු හා පිඟන් කෝප්ප | වසර 3 | 33.33 % |
| කාමර හණ රෙදි | වසර 3 | 33.33 % |
| ආරක්ෂිත උපකරණ | වසර 3 | 33.33 % |
| පුද්තකාල පොත් | වසර 3 | 33.33 % |
| පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා උපාංක | වසර 5 | 20 % |
| ගණක යන්ත්‍ර හා ඔරලෝසු | වසර 5 | 20 % |
| බල සැපයුම් උපකරණ | වසර 5 | 20 % |
| පිත්තල අයිතම | වසර 5 | 20 % |
| මෝටර් වාහන | වසර 5 | 20 % |
| වායු සමන යන්ත්‍ර/ සේප්පු | වසර 10 | 10 % |
| ගොඩනැගිලි | වසර 10 | 10 % |
| දීර්ඝ කළ හැකි වත්කම් | වසර 10 | 10 % |
| යන්ත්‍රෝපකරණ හා මෙවලම් | වසර 10 | 10 % |
| කාර්යාල උපකරණ | වසර 10 | 10 % |
| ශීතකරණ | වසර 10 | 10 % |
| අන්තර්ජාල සවිකිරීම් | 0 | |

ජාතික පර්යේෂණ සභා ප්‍රදාන මඟින් මිලදී ගන්නා දේපළ, පිරියත හා උපකරණයන් අපේක්ෂිත ඵලදායී ජීව කාලයන් පුරා එම වත්කම් පවරා දෙන තෙක් හෝ ඉවත් කරන තෙක් වර්තමාන හා සංසන්දනාත්මක කාලච්ඡේද සඳහා පහත දැක්වෙන ඵලදායී ජීව කාලයක් හා ප්‍රතිශතයන් පදනම් කරගෙන ක්ෂය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| රසායනාගාර උපකරණ (1 වර්ෂය) | වසර 10 | 10 % |

රසායනාගාර උපකරණ (2 වර්ෂය) වසර 5 20 %

ක්ෂය කිරීමේ ක්‍රම, ඵලදායී කාලයක් හා අවශේෂ වටිනාකම් වාර්තාකරන දිනයට යලි අගය කරනු ලැබේ.

**3.2.1.4. ශේෂ පත්‍රයෙන් කපාහැරීම**

දේපළ, පිරියත හෝ උපකරණ ධාරණ අගයන් හෝ ඕනෑම අනුරූප පිරිවැයක්, එහි භාවිතය හෝ ඉවත්කිරීමෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කළ නොහැකි විටදී හෝ එය ඉවත් කිරීමේදී ශේෂ පත්‍රයෙන් කපාහැරේ. එලෙස වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම තුලින් (ඉවත් කිරීමේ ශුද්ධ ආදායම හා වත්කම්හී ධාරණ අගයන් අතර වෙනස ලෙස ගණනය කරනු ලැබු) ලද ලැබීම් සහ පාඩු ලාභ සහ අලාභ ලෙස ) මූල්‍යමය කාර්යසාධන ප්‍රකාශනයන්හී) වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත්කළ සහ ලැබීම් ආදායම් ලෙස වර්ගීකරණය නොකළ වසර තුලදී හඳුනාගැනේ.

**3.2.2. අස්පෘෂ්‍ය වත්කම් සහ ක්‍රමක්ෂය**

අස්පෘෂ්‍ය වත්කම් අනාගත ආර්ථික ප්‍රතිලාභ ජාතික පර්යේෂණ සභාවට අපේක්ෂා කළ හැකි නම් හා එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි නම් ඒවා අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගනී. මෙම වත්කම් ශේෂ පත්‍රයේදී පිරිවැයෙන් සම්මුචිත ක්‍රමක්ෂය අඩුකළ අගයට දක්වයි. ක්‍රමක්ෂය ලාභයට හෝ අලාභයට හඳුනාගන්නේ අස්පෘෂ්‍ය වත්කම් ඒවා භාවිතයට සූදානම් දින සිට ඒවායේ ඵලදායී ජීව කාලය පුරා සෘජු රේඛීය ක්‍රමයටය.

**3.2.3. තොග**

තොග ඓතිහාසික පිරිවැය පදනමින් මනිනු ලැබේ.

**3.2.4. වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ**

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ඒවායේ ඇස්තමේන්තුගත උපලබ්ධි කළ හැකි ප්‍රමාණයන් අනුව දක්වනු ලැබේ.

**3.2.5. ජාතික පර්යේෂණ සභා ප්‍රදාන**

ජාතික පර්යේෂණ සභා ප්‍රදානයන්ගෙන් වසර ගණනාවක් පුරා ප්‍රදානය කළ පර්යේෂණ ප්‍රදානයන්ගේ මුළු එකතුව නියෝජනය වේ.

ජාතික පර්යේෂණ සභා ප්‍රදානයන්ගෙන් දරණ වියදම් ඒවා ඇති වන කාලච්ඡේදයේ වියදම් ලෙස, එම වියදම් සෘජුව අත්පත් කරගැනීම් සඳහා සෘජුව දායකවීම, ඉදිකිරීම හෝ වත්කම් නිෂ්පාදනය යන අවස්ථාවන්හිදී දේපළ, පිරියත හා උපකරණයන්හී කොටසක් සේ හඳුනාගන්නා අවස්ථාවන්හිදි හැර දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් කොටසක් ලෙස ඒවා ඉවත් කිරීමේ හෝ පැවරීම සිදුකෙරෙන තෙක් ආදායම් ප්‍රකාශනයේ සඳහනාගනී.

අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ වත්කම් නිෂ්පාදනයට දරණ වියදම් හැර අනෙකුත් වියදම්, වියදම දරණ වසරේදී ආදායම් හඳුනාගන්නා අතර පර්යේෂණ ප්‍රදානයන් සඳහා ලැබෙන මුදල් සෘජුවම සම්මුචිත මුදලට ප්‍රාග්ධනිත කෙරේ.

පර්යේෂණ ප්‍රදානයන්ගෙන් දරණ වියදම්, වියදම් ලෙස ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගන්නා අදාල කාලච්ඡේදයට අදාලව පුනරාවර්තන ආදායමෙහි කොටසක් ලෙස ආදායමෙහි හඳුනාගැනේ.

**3.3 බැරකම්**

බැරකම් වර්ගීකරණයේදී ශේෂ පත්‍රයේ ජංගම බැරකම් ලෙස දක්වනුයේ ඉල්ලීම මත ගෙවීම් යටතට වාර්තා කරන දින සිට වසරක් තුලදී ගැනෙන ශේෂයන්ය. ජංගම නොවන වගකීම් වනුයේ වාර්තාකරන දින සිට වසරකට පසුව ඉල්ලුම මත ගෙවීම් යටතට ගැනෙන ශේෂයන්ය.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ශේෂ පත්‍ර දිනට සියලු හඳුනාගත් වගකීම් ගිණුම්ගත කරනු ලැබේ.

**3.3.1. සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල**

අදාල ව්‍යවස්ථාවන් හා නීතිරීතීන් හා අනුකූලව, සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල් දායකත්වයන් හා සේවා නියුක්තිකයන්ගේ භර අරමුදල් දායකත්වයන් සඳහා

සේවකයින් සුදුසුකම් ලබයි. මේවා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි දක්වා ඇත්තේ වියදමක් ලෙසිනි.

සේවක අර්ථසාධක අරමුදල සඳහා අඩුකිරීම් පහත පරිදි වේ.

| | |
|---|---|
| සේව්‍යයා | 12% |
| සේවකයා | 8% |

සේවක භාර අරමුදල සඳහා අඩුකිරීම් පහත පරිදි වේ.

| | |
|---|---|
| සේව්‍යයා | 3% |

### 3.3.2. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ පිරිවැයට දක්වනු ලැබේ.

### 3.4. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය (ආදායම් ප්‍රකාශනය) ඉදිරිපත් කිරීම සඳහා වියදමේ ස්වභාවය අනුව දැක්වීමේ ක්‍රමය යොදා ගනී.

### 3.4.1 ආදායම්

සලකා බලන කාලච්ඡේදය තුළ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලැබෙන ප්‍රදානයන් පිළිවෙලින් ආදායම් ප්‍රකාශනයට හා සම්මුච්ත අරමුදලට හඳුනාගනී. පර්යේෂණ ප්‍රදානයන්ගෙන් දරණ වියදම්, වියදම් ලෙස ආදායම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගන්නා අදාල කාලච්ඡේදයට අදාලව පුනරාවර්තන ආදායමෙහි කොටසක් ලෙස ආදායමෙහි හඳුනා ගැනේ. ශුද්ධ විකුණුම් හෝ දේපළ, පිරියත හා උපකරණවල ධාරණ අගය හුවමාරු උත්පාදනයන් සමඟ සැසඳීමෙන් තීරණය වන දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ඉවත් කිරීමේ හෝ පැවරීම තුලින් අත්වන ලාභ හා පාඩු ලාභයේ හෝ අලාභයේ හඳුනාගැනේ.

### 3.4.2. වියදම්

ජාතික පර්යේෂණ සභා මෙහෙයුම් සඳහා දරණ ලද සෑම වියදමක්ම වසරේ ලාභය/ අලාභය හඳුනාගැනීමේදී ආදායමට ගනු ලැබේ. අළුත්වැඩියා හා නැවත ඇරඹීම් අදාල වියදම දරණ ලද කාච්ඡේදයේ ලාභය/ අලාභයට ආරෝපණය කෙරේ.

පර්යේෂණ ප්‍රදාන මඟින් දරණ වියදම්ද එම වියදම් ඍජුව අත්පත් කරගැනීම් සඳහා දායක වීම, ඉදිකිරීම හෝ වත්කම් නිෂ්පාදනය යන අවස්ථාවන්හිදී දේපළ, පිරියත හා උපකරණයන්හී කොටසක් සේ හඳුනාගන්නා අවස්ථාවන්හිදී හැර පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස දරණ ලද කාලච්ඡේදයේ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනී.

විදේශ මුදල් ගණුදෙනු පරිවර්තනය තුලින් වන ලාභ හා අලාභයන්ගෙන් සමන්විත මූල්‍ය ආදායම් හා වියදම් එය හටගත් අවස්ථාවේදී ලාභ හා අලාභ ලෙස හඳුනාගනී.

කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගැනේ.
අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ.

### 3.5. ශේෂ පත්‍ර දිනෙන් පසුව සිද්ධීන්

සියලු ප්‍රමාණාත්මක ශේෂ පත්‍ර දිනෙන් පසුව වන සිද්ධීන් සළකන ලද අතර අදාල පරිදි ගැලපුම් හා හෙළිදරව් කිරීම් අදාල සටහන්හී දැක්වීම මඟින් සිදු කරන ලදී.

### 3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඍජු ක්‍රමය යොදාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කරනු ලැබේ.

### 3.7 SLFRS පළමු වරට භාවිතා කිරීම

ජාතික පර්යේෂණ සභාව විසින් 2012 ජනවාරි 01 දින සිට බලපැවැත් වූ LKAS සහ SLFRS ඇතුලත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිතයට ගන්නා ලදි. SLFRS භාවිතා කිරීමට පෙර, ජාතික පර්යේෂණ සභා විසින් සිය මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරනු ලැබුවේ පොදුවේ පිළිගනු ලැබූ ගිණුම්කරණ මූලධර්මයන් හා භාවිතයන් හා අනුකූල වෙමිනි. සටහන 2 හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා අනුකූලව මෙම මූල්‍යමය ප්‍රකාශනයන් පිළියෙල කොට ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමේදී ජාතික පර්යේෂණ සභාව විසින් SLFRS 1 හි අවශ්‍යතාවන් ක්‍රියාත්මකව පවතින SLFRS හි ප්‍රත්‍යක්ෂණ භාවිතය ඇතුලත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හී ප්‍රථම වරට යොදා ගැනීම - අනුව කටයුතු කොට ඇත.

### 3.8. ගණකාධිකරණ ප්‍රතිපත්තියෙහි වෙනස්කම්

**ජාතික පර්යේෂණ සභාව**
## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආදායම් හඳුනාගැනීම සඳහා සහ පර්යේෂණ ආයතනයන් වෙත අයිතම පවරාදීමෙන් උපයාගත් ආදායම් හඳුනාගැනීම සඳහා යොදා ගැනෙන ගිණුම් සහ ප්‍රතිපත්තිය පහත දැක්වෙන සභා තීරණයන් වෙනස්කොට ඇත. ජාතික පර්යේෂණ සභාවේ මෙහෙයුම්හී සත්‍ය ස්වභාවය පිළිබිඹු වන අයුරින් මෙම වෙනස්කම් සිදුකොට ඇත්තේ ආදායම් ප්‍රකාශය / මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි වත්මන් රූපය යථාර්ත නොවන බව පෙන්නුම් කරන හෙයිනි.

**වෙනස්කම් සිදුකරනු ලැබූ ඡේදය පහත පරිදි වේ;**
"ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදානයන් යටතේ සිදු වූ වියදම් ලෙස ගැනෙන ප්‍රදාන ලෙස පිරිනැමෙන උපකරණයන්ගේ වාර්ෂික ක්ෂය වීම සහ පර්යේෂණ මධ්‍යස්ථාන වෙත උපකරණ පවරා දීමේදී නැතිවීම යනාදිය අදාල කාලසීමාවන්හී ආදායම් ප්‍රකාශයෙහි පුනරාවර්තන ලැබීම්හි කොටසක් ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අපහරණය හෝ පවරාදීමේදී අලාභයන් තීරණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් සහ පවරාදීමේ ආදායම් දේපළ, පිරියත හා උපකරණයන්හී එළඹෙන වර්ෂය වෙත රැගෙන යන ඉතිරි ප්‍රමාණය සමඟ සංසන්දනය කිරීමෙනි. මෙහෙයුම්හී සත්‍ය ස්වභාවය. මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිබිඹු කිරීම සඳහා ආදායම් මත බලපෑමද ආදායමක් ලෙස හඳුනාගැනේ. ලැබීම් ඒ අනුව ගලපනු ඇත."

ජාතික පර්යේෂණ සභාවෙහි පෙර පැවති ප්‍රතිපත්තිය අනුව අලාභයන් සහ පවරාදීමෙන් උපයන ලද ආදායම්, මූල්‍යමය කාර්යසාධන ප්‍රකාශයෙහි ආදායම් ලෙස හඳුනාගනු නොලැබූ අතර, එමගින් ආදායම් ප්‍රකාශයෙහි යථාර්ත නොවන අලාභයන් පෙන්වා දී ඇත.

මෙම ප්‍රතිපත්තිය වෙනස් කිරීමට තීරණය වූ අතර පූර්ව වර්ෂය සඳහා ගැලපීම් සිදු කෙරිණි. ගිණුම් වෙත මෙම වෙනස්කම් හරහා සිදු වූ බලපෑම සටහන 3.13 යටතේ දක්වා ඇත.

### 3.8. දෝෂයන් සහ නිවැරදි කිරීම්

ක්ෂය වන වත්කම්හී අධික /ඌන ක්ෂයවීම නිවැරදි කර ඇති අතර දෝෂයන් නිවැරදි කිරීම සඳහා මූල්‍යමය ප්‍රකාශනයන්හී නැවත සඳහන් කොට ඇත. වෙනස්කම් හේතුවෙන් ගිණුම් වෙත සිදු වූ බලපෑම සටහන 3.14 යටතේ දක්වා ඇත.

**ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව**
**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍යමය ප්‍රකාශනයන් සඳහා සටහන්**

**3.8 දේපළ, පිරියත හා උපකරණ**

**3.8.1. දළ පවත්නා ප්‍රමාණයන්**

| පිරිවැය | 2012.12.31 දිනය ශේෂය (ගලපන ලද) රු. | එකතුකිරීම් / පැවරීම් | ඉවත්කිරීම් / පැවරීම්* | 2013.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ජාතික පර්යේෂණ සභා කාර්යාල වත්කම් | 8,781,739.03 | 736,425.87 | 102,630.42 | 9,415,534.48 |
| ප්‍රදානයන්හි ප්‍රධාන උපකරණ | 254,476,785.96 | 66,256,119.21 | 96,754,482.21 | 223,978,422.97 |
| ප්‍රදානයන්හි සුළු උපකරණ | 16,159,120.50 | 14,376,043.36 | 4,064,611.61 | 26,470,552.25 |
| **මුළු - වත්කම්** | **279,417,645.49** | **81,368,588.44** | **100,921,724.24** | **259,864,509.70** |

**3.8.2. ක්ෂය**

| | 2012.12.31 දිනට ශේෂය (ගලපන ලද) රු. | එකතුකිරීම් / පැවරීම් | ඉවත්කිරීම් / පැවරීම් | 2013.12.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| **අඩු කළා : ක්ෂය සඳහා වෙන්කිරීම්** | | | | |
| ජාතික පර්යේෂණ සභා කාර්යාල වත්කම් | 5,933,630.07 | 609,577.85 | 97,192.28 | 6,446,015.64 |
| ප්‍රදානයන්හි ප්‍රධාන උපකරණ | 85,131,284.14 | 25,095,627.61 | 65,306,384.45 | 44,920,527.30 |
| ප්‍රදානයන්හි සුළු උපකරණ | 6,388,397.10 | 3,947,622.70 | 3,709,994.77 | 6,626,025.03 |
| **එකතුව - ක්ෂය සඳහා වෙන්කිරීම්** | **97,543,311.31** | **29,652,828.16** | **69,113,571.50** | **57,992,567.97** |

**3.8.3 PPEහි ශුද්ධ පොත් වටිනාකම**

| | **2013** රු. | **2012** ගලපන ලද රු. |
|---|---|---|
| ජාතික පර්යේෂණ සභා කාර්යාල වත්කම් | 2,969,518.84 | 2,848,108.96 |
| ප්‍රදානයන්හි ප්‍රධාන උපකරණ | 179,057,895.65 | 169,345,501.81 |
| ප්‍රදානයන්හි සුළු උපකරණ | 19,844,527.22 | 9,770,723.41 |
| **එකතුව** | **201,871,941.71** | **181,964,334.18** |

### 3.09 පුනරාවර්තන ලැබීම්

| | 2013 රු. | 2012 (ගලපන ලද) රු. |
|---|---|---|
| **3.09 අ පර්යේෂණ සහ සංවර්ධන** | | |
| ප්‍රදානලාභීන්ගේ පාරිභෝගික ද්‍රව්‍ය | 34,508,642.74 | 20,772,469.42 |
| ප්‍රදානලාභීන්ගේ ලිපිලේඛන | - | - |
| ප්‍රදානලාභීන්ගේ පශ්චාත් උපාධි දීමනා | 41,068,001.18 | 24,962,469.50 |
| ප්‍රදාන සහ වැඩසටහන් පරිපාලන | 3,088,236.89 | 535,056.00 |
| හුවමාරුවෙන් ලද මුදල | 31,802,714.60 | - |
| PPP වැඩසටහන් වියදම් | 4,286,951.00 | - |
| PASR වැඩසටහන් වියදම් | 110,509.10 | 971,944.00 |
| ප්‍රදානලාභීන්ගේ ගමන් වියදම් | 1,957,344.68 | 471,281.50 |
| **3.09අ** | **116,822,400.19** | **47,713,220.42** |
| ප්‍රධාන සහ සුළු උපකරණයන්ගේ ක්ෂය | 29,043,250.31 | 21,819,195.33 |
| **3.09ආ** | **145,865,650.50** | **69,532,415.75** |
| **භාණ්ඩාගාර පුනරාවර්තන නිදහස් කිරීම** | | |
| ජනවාරි සිට දෙසැම්බර් | 9,867,000.00 | 9,189,900.00 |
| භාණ්ඩාගාරයට ආපසු යැවීම | - | - |
| **3.09ඇ** | **9,867,000.00** | **9,189,900.00** |
| **මුළු එකතුව (3.09අ + 3.09ආ + 3.09ඇ)** | **126,689,400.19** | **56,903,120.42** |

### 3.10 වෙනත් මූල්‍ය වත්කම්

| | 2013 රු. | 2012 (ගලපන ලද) රු. |
|---|---|---|
| ගොඩනැගිලි කුලී තැන්පතු | 465,000.00 | 465,000.00 |
| දුරකථන තැන්පතුව | 15,000.00 | 15,000.00 |
| ප්‍රවාහන තැන්පතුව | - | - |
| **එකතුව** | **480,000.00** | **480,000.00** |

### 3.11 පූර්ව ගෙවීම්

| | 2013 රු. | 2012 (ගලපන ලද) රු. |
|---|---|---|
| ගොඩනැගිලි කුලී | 250,000.00 | 250,000.00 |
| හෝටල් සඳහා අත්තිකාරම් වෙන්කිරීම් | 150,000.00 | - |
| **එකතුව** | **400,000.00** | **250,000.00** |

### 3.12 ගෙවිය යුතු දෑ

| | 2013<br>රු. | 2012 (ගලපන ලද)<br>රු. |
|---|---|---|
| ගෙවිය යුතු දුරකථන ගාස්තු | 45,713.84 | 22,757.66 |
| ගෙවිය යුතු විදුලි ගාස්තු | 59,503.84 | 36,709.74 |
| ගෙවිය යුතු ජල ගාස්තු | 1,045.24 | 517.44 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | - | - |
| ගෙවිය යුතු වෙනත් දෑ | 494,957.76 | 434,283.92 |
| ගෙවිය යුතු සේ.නි.අ.සා. අරමුදල් | - | - |
| ගෙවිය යුතු සේ.භා. අරමුදල් | - | - |
| **එකතුව** | **601,220.68** | **494,268.76** |

### 3.13 නැවත සඳහන් කිරීම් මඟින් වූ බලපෑම

| | 2013 | 2012 (ගලපන ලද) |
|---|---|---|
| මුළු වියදම්හී වැඩිවීම (අඩුවීම) | 0 | 0 |
| මුළු ආදායම්හී වැඩිවීම (අඩුවීම) | 60,845,964.91 | 21,819,195.33 |
| කාලසීමාව සඳහා ශුද්ධ ලාභයෙහි වැඩිවීම (අඩුවීම) | (60,845,964.91) | (21,819,195.33) |
| ප්‍රදානයන්හී වැඩිවීම (අඩුවීම) | 0 | 0 |
| සමුච්චිත අරමුදලෙහි වැඩිවීම (අඩුවීම) | 0 | 0 |
| ශුද්ධ වත්කම්හී වැඩිවීම (අඩුවීම) | 0 | 0 |
| PPEහී වැඩිවීම (අඩුවීම) (ශුද්ධ පොත් වටිනාකම) | 0 | 0 |

### 3.14 දෝෂ නිවැරදි කිරීම්

| | 2013 | 2012 (ගලපන ලද) |
|---|---|---|
| මුළු වියදම්හී වැඩිවීම (අඩුවීම) | 0 | (127,036.42) |
| මුළු ආදායම්හී වැඩිවීම (අඩුවීම) | 0 | 0 |
| කාලසීමාව සඳහා ශුද්ධ ලාභයෙහි වැඩිවීම (අඩුවීම) | 0 | 127,036.42 |
| ප්‍රදානයන්හී වැඩිවීම (අඩුවීම) | 0 | 0 |
| සමුච්චිත අරමුදලෙහි වැඩිවීම (අඩුවීම) | 0 | 108,532.02 |
| ශුද්ධ වත්කම්හී වැඩිවීම (අඩුවීම) | 0 | 108,532.02 |
| PPEහී වැඩිවීම (අඩුවීම) (ශුද්ධ පොත් වටිනාකම) | 0 | 108,532.02 |

# විගණකාධිපතිගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : එල්එස්2/එෆ්/එන්ආර්සී/1/2013

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2014 දෙසැම්බර් 5 දින

National Research Co... 10 DEC 2014 Colombo 7.

සභාපති,

ජාතික පර්යේෂණ සභාව.

**ජාතික පර්යේෂණ සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ජාතික පර්යේෂණ සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපති වෙත 2014 අගෝස්තු 28 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 හා 2013 වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ජනාධිපති සම්මාන උළෙල සඳහා ලබාදුන් රු. 75,000 ක අත්තිකාරම් මුදල අත්තිකාරම් ලෙස සටහන් කිරීම වෙනුවට මුදල් හා මුදල් සමාන දෑ හි අඩංගු කර තිබුණි.

#### 2.2.2 ලැබිය යුතු ගිණුම්

2012 ජුනි දක්වා පර්යේෂණ සභාව පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල වෙනුවෙන් තැන්පත් කරන ලද රු. 90,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| II පරිච්ඡේදයේ 12.5.4 ඡේදය සහ 13.3 ඡේදය | වැඩ බැලීමේ පත්කිරීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද ඊට පටහැනිව ජාතික පර්යේෂණ සභාවේ ලේකම් තනතුර සඳහා 1999 වර්ෂයේ සිට ද ගණකාධිකාරී තනතුර සඳහා 2003 වර්ෂයේ සිට ද වැඩ බැලීමේ පත්වීම් සිදුකර තිබුණි.<br>වැඩ බැලීමේ පත්වීමක් සඳහා ගෙවිය යුතු දීමනාව මූලික වැටුපෙන් සියයට 25 නොඉක්මවිය යුතු වුවද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා රු.303,756 ක් වූ වැටුප් ලේකම් තනතුරේ හා සමාලෝචිත වර්ෂයේදී රු.90,900 ක වැටුප් ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) 1978 දෙසැම්බර් 29 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු.201,871,941 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

4

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| (i) 9.2 වගන්තිය | ආයතනයේ සංවිධාන සටහන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙ ලියාපදිංචි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 9.3.1 වගන්තිය | පර්යේෂණ සභාව පිහිටුවා අවුරුදු 06 කට අධික කාලයක් ගත වී ඇතත් විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) 2012 අගෝස්තු 17 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ Dms/1765 දරන ලිපිය | අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර කාර්ය පැවරුම් පදනම මත නිලධාරීන් 6 දෙනෙකු අනුමැතිය ලබා ගැනීමෙන් තොරව බඳවා ගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු. 911,390 ක දීමනා ගෙවා තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පර්යේෂණ සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.2,357,760 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.443,022 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,800,782 ක පිරිහීමක් දක්නට ලැබුණි. මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීම සඳහා කාර්ය මණ්ඩල වියදම් රු.2,000,000 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

--------------------------------------

ජංගම වත්කම් වලින් සියයට 99 ක් පර්යේෂණ ප්‍රදාන වෙනුවෙන් බැංකු ජංගම ගිණුම් වල තැන්පත් කර ඇති මුදල් වලින් නියෝජනය කෙරේ.

5

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(ආ) 2006 – 2013 දක්වා කාලපරිච්ඡේදය තුළ ජාතික පර්යේෂණ සභාව පර්යේෂණ 247 ක් සඳහා රු. 919,000,000 ක මුදලක් ප්‍රදානය කර තිබූ අතර ඉන් පර්යේෂණ ප්‍රදාන 39 ක් සඳහා විද්‍යා නාමකරණ දර්ශක (Science Citation Index) ප්‍රකාශන හා පර්යේෂණ 47 ක් සඳහා වෙනත් ජාත්‍යන්තර ප්‍රකාශන සිදු කර තිබුණි. එසේම පර්යේෂණ 19 ක් අතහැර දමා තිබූ අතර නිමකල පර්යේෂණ 74 ක් සඳහා පමණක් පේටන්ට් අයිතිය ලබාගෙන තිබුණි.

(ඇ) වර්ෂ 03 ක කාලසීමාව තුළ භාණ්ඩාගාර ප්‍රතිපාදන වැයකර සිදුකල පර්යේෂණවල අවසන් ප්‍රතිඵලය පර්යේෂණ ප්‍රකාශනයකට සීමා වී තිබූ අතර, පර්යේෂණ ප්‍රතිඵල භාවිතයට නොගැනීමත්, පේටන්ට් අයිතිය ලබා ගැනීමට කටයුතු නොකිරීමත් නිසා පර්යේෂණ සඳහා ලබාදෙන මුදලට නිසි අගයක් නොලැබෙන බව නිරීක්ෂණය විය.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ ව්‍යාපෘති 60 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 273,000,000 ක ප්‍රතිපාදන සැලසුම් කළද, සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණේ පර්යේෂණ 41 ක් සඳහා රු. 217,000,000 ක් පමණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී විද්‍යා නාමකරණ දර්ශකයේ (SCI) ප්‍රකාශන සිදුකළ පර්යේෂණයන් 350 කට සම්මාන ප්‍රදානයන් කිරීමට සැලසුම් කළද, වර්ෂය තුළදී එකදු සම්මානයක් හෝ ලබාදී නොතිබුණි.

(ඊ) පශ්චාත් උපාධි අපේක්ෂකයින් 60 දෙනෙකු ලියාපදිංචි කරවීමට සැලසුම් කළද, උපාධි අපේක්ෂකයින් 36 දෙනෙකු පමණක් ලියාපදිංචි කර තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයට පෙර ජනාධිපති කාර්යාලය යටතේ පර්යේෂණායතනයක් ලෙස පැවති ජාතික පර්යේෂණ සභාව, 2007 සැප්තැම්බර් 15 දිනැති අංක, 1514/28 දරන අති විශේෂ ගැසට්පත්‍රය මඟින් ජනාධිපති විශේෂ විධිවිධාන යටතේ පිහිටුවා ඇත. ජනාධිපති විශේෂ විධිවිධානයේ දක්වා ඇති පරිදි ව්‍යවස්ථාවක් මඟින් පර්යේෂණ සභාවක් පිහිටුවන තුරු මෙම ආයතනය පිහිටුවා තිබුණ ද, 2013 වර්ෂය අවසාන වන විට ද ව්‍යවස්ථාවක් සකස් කර ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පර්යේෂණ සභාව පිහිටු වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති ගිවිසුමේ 06 පරිච්ඡේදය අනුව අවසන් වූ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් මිලදී ගෙන තිබූ ස්ථාවර වත්කම්/ උපකරණ නැවත ජාතික පර්යේෂණ සභාව වෙත පවරා ගැනීම හෝ අදාළ පර්යේෂණ ආයතනයට පැවරීම හෝ වෙනත් පර්යේෂණ ව්‍යාපෘතියකට මාරු කිරීම කළ යුතු වුවත් 2008 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුළ අවසන් කර තිබූ ව්‍යාපෘති 06 කට අදාළව රු. 13,233,927 ක් වූ වත්කම් හා උපකරණ සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව පවරාදීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පවරා දුන් රු.100,819,092 ක් වූ වත්කම් විධිමත් පරිදි පවරාදීමක් සිදුකර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති කාලසීමාව අවසන් වීමෙන් පසු පර්යේෂණ 11 ක් සම්බන්දයෙන් ඉදිරිපත් කරන ලද අවසාන වාර්තා වසර 1 සිට වසර 4 දක්වා ගත වී තිබුණ ද අදාළ ඇගැයීම් කටයුතු 2013 දෙසැම්බර් 31 දින වනවිටද සිදුකර නොතිබුණි.

(ඈ) 2007, 2008 හා 2009 වර්ෂ සඳහා ජනාධිපති සම්මාන උළෙල 2011 වර්ෂයේ දී පැවැත්වීම සඳහා සැලසුම්කර අයදුම්පත් කැඳවීම සිදුකර තිබුණ ද සම්මාන උළෙල පවත්වා නොතිබුණි. මේ සඳහා 2011, 2012 හා 2013 වර්ෂවල ක්‍රියාකාරී සැලැස්මට අනුව පිළිවෙලින් රු. 1,550,000, රු. 2,730,000 හා රු. 1,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සම්මාන උළෙල පවත්වන ලද්දේ 2014 වර්ෂයේදීය.

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාතික පර්යේෂණ සභාව මගින් තෝරාගනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමේ දී, පර්යේෂණ ආරම්භ කරන අවස්ථාවේදීම අවුරුදු 03 ක් වැනි කාලපරිච්ඡේදයකට අදාළ සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඒ ඒ ව්‍යාපෘතිය යටතේ ජංගම ගිණුම්වලට බැර කරනු ලබන අතර පසුගිය වර්ෂ කිහිපයක බැංකු ජංගම ගිණුම් ශේෂයන් පරීක්ෂා කිරීමේ දී ජංගම ගිණුම්වල පහත සඳහන් පරිදි අඛණ්ඩව අධික මුදලක් නිෂ්ක්‍රීයව තිබූ බව නිරීක්ෂණය විය.

| වර්ෂය | ජංගම ගිණුම්වලට බැරකල ප්‍රතිපාදිත මුදල | බැංකු ජංගම ගිණුම්වල වර්ෂය අවසානයේ ඉතිරි මුදල |
|---|---|---|
| | රු. | රු. |
| 2011 | 200,000,000 | 268,113,399 |
| 2012 | 220,000,000 | 346,873,287 |
| 2013 | 217,000,000 | 396,340,514 |

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් කළ ව්‍යාපෘති 18 ක් සඳහා ලබාදුන් ප්‍රතිපාදන මුදලින් විශාල මුදල් ප්‍රමාණයක් වියදම් නොවී ඉතිරිව තිබූ බව ජංගම ගිණුම් පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබූ අතර එම ප්‍රතිපාදන ද දීර්ඝ කාලපරිච්ඡේදයක් බැංකු ගිණුම්වල අක්‍රියව තිබුණි. ඒ අනුව රු. 23,736,730 ක මුදල් ප්‍රමාණයක් 2009 සිට 2013 දක්වා අවුරුදු 03 කට අධික කාලපරිච්ඡේදයක් තුල නිෂ්ක්‍රියව බැංකු ජංගම ගිණුම්වල අක්‍රියව තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය. මේ පිළිබඳව කළමනාකරණය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) වර්ෂ 03 ක් වූ ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ දී ව්‍යාපෘතියට අවශ්‍ය උපකරණ හා රසායන ද්‍රව්‍ය කඩිනමින් මිලදී ගෙන පර්යේෂණ කටයුතු අදාළ කාලපරිච්ඡේදය තුළ දී නිමකල යුතු වුව ද ව්‍යාපෘති කාලසීමාව අවසන් වී 2012 වර්ෂයේ දී ව්‍යාපෘති ජංගම ගිණුම් වසා තිබූ 08-29 ව්‍යාපෘතිය සඳහා ජාතික පර්යේෂණ සභාවේ බැංකු ගිණුමෙන් 2013 වර්ෂයේ දී රු. 217,785 ක රසායන ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි.

(ඈ) ව්‍යාපෘති ගිවිසුමේ 8(1) හා (11) ඡේදය අනුව අත්හැර දැමූ හා නිම නොකල ව්‍යාපෘති සම්බන්ධව බැංකු ජංගම ගිණුම් කඩිනමින් වසා දැමිය යුතු අතර එම ගිණුම්වල ඉතිරි මුදල් කඩිනමින් ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එහෙත් එකතුව රු. 38,659,069 ක පර්යේෂණ ප්‍රදාන ලබාගත් පර්යේෂකයන් 18 දෙනෙකුගේ ව්‍යාපෘති අතරමග නවතා දමා තිබුණ ද, එම බැංකු ජංගම ගිණුම් කඩිනමින් වසා දමා ඉතිරි මුදල් ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) (i) සමාලෝචිත වර්ෂයේ දී පර්යේෂණ ක්ෂේත්‍රය සඳහා ජාතික පර්යේෂණ සභාව හා පෞද්ගලික අංශය සියයට 50 බැගින් දායක වීම මත "රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේ හවුල්කාරික වැඩසටහන" සඳහා ව්‍යාපෘති 04 ක් යටතේ පෞද්ගලික සමාගම් 04 ක් සමග ගිවිසුම් වලට එළඹ තිබුණි. ව්‍යාපෘති කාල සීමාව අවුරුදු 03 ක් වන අතර ව්‍යාපෘති ආරම්භක දිනය වූ 2013 මැයි 17 දින ව්‍යාපෘති 04 සඳහා ජාතික පර්යේෂණ සභාවේ දායක මුදල වූ රු. 45,798,008 ක් එකවර ජංගම ගිණුමකට බැරකර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගතිය සලකා බලා ප්‍රතිපාදන වරින් වර මුදාහරිනු වෙනුවට රුපියල් මිලියන 45 කට අධික මුදලක් එකවර මුදා හැරීමෙන් රජයේ මුදල් අක්‍රියව ජංගම ගිණුම්වල රඳවා තිබෙන බව නිරීක්ෂණය විය.

(ii) ව්‍යාපෘති බැංකු ජංගම ගිණුම් පරීක්ෂාවේ දී 2013 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු.41,948,125 ක් වූ අතර, එක් ව්‍යාපෘතියක් (12-18 ව්‍යාපෘතිය) සඳහා උපකරණයක් මිලදී ගැනීමට 2013 දෙසැම්බර් 18 දින ණයවර ලිපියක් විවෘත කිරීම හැරුනු විට ව්‍යාපෘති 04 වෙනුවෙන් වෙනත් කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

(iii) ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව 2013 දෙසැම්බර් 31 දින වන විට අදාළ පෞද්ගලික සමාගම් 04 ද දායක මුදල් ලෙස එකතුව රු. 23,465,600 ක් බැංකු ගත කළ යුතු වුවද බැංකු ගතකර තිබුණේ රු. 3,937,588 ක් පමණි.

(iv) ගිවිසුමේ II පරිච්ඡේදය අනුව මාස 06 කට වරක් පෞද්ගලික සමාගම් විසින් හය මාසික ප්‍රගති වාර්තා ජාතික පර්යේෂණ සභාව වෙත ඉදිරිපත් කල යුතු වුව ද ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(v) ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු.78,370,921 ක මුදලින් රු.32,572,913 ක මුදලක් උක්ත ව්‍යාපෘතියේ අරමුණු වෙනුවෙන් නොයොදවා පර්යේෂණ සභාවේ වෙනත් කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ සභාවේ ලේකම් තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කල මාසික වැටුප රු. 38,530 ක් වුව ද ඒ සඳහා නිලධාරියෙකු බඳවා නොගෙන මූලික අධ්‍යයන ආයතනයෙන් මුදාහල නිලධාරිනියක් ලේකම් තනතුරේ යෙදවීම නිසා මාසිකව රු. 73,367 බැගින් දීමනා ගෙවීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා රු. 243,860 ක අතිරේක මුදලක් පර්යේෂණ සභාවට දැරීමට සිදු වී තිබුණි.

(ආ) පර්යේෂණ ව්‍යාපෘතියක් සඳහා මිලදීගත් උපකරණයක් ක්‍රියාවිරහිත වීම නිසා එම උපකරණය 2009 ජුලි මස නැවත මිලදී ගත් ආයතනයට භාර දී තිබූ අතර ඒ වෙනුවෙන් තවදුරටත් ලැබිය යුතුව තිබූ මුදල වූ රු. 150,869 ක් පාලක සභා අනුමැතියෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී කපාහැර තිබූ අතර උපකරණය සඳහා ගෙවූ එකතු කළ අගය මත බදු මුදල වූ රු.159,000 ක් පෙර වර්ෂයේදී ගිණුම්වලින් ලියාහැර තිබුණි.

4.5 අරමුණු වලට පටහැනි වියදම්

----------------------------------

2007 සැප්තැම්බර් 15 දිනැති අංක 1514/28 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව දැනුම හා විද්‍යාව පදනම කරගෙන පර්යේෂණ කටයුතු වැඩිදියුණු කිරීම ජාතික පර්යේෂණ සභාවේ මූලික අරමුණ වුව ද එයට පරිබාහිර වූ අවස්ථා 2 ක් සඳහා රු.1,250,00 ක් සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රදානය කර තිබුණි.

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 9 ක් පැවතුණි.

(ආ) ජාතික පර්යේෂණ සභාවේ ඉහළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ හා විධායක තනතුර වූ ලේකම් තනතුර 1999 වර්ෂයේ සිට ද, ගණකාධිකාරි තනතුර 2003 වර්ෂයේ සිට ද පුරප්පාඩුව පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද පුරප්පාඩු පිරවීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) පර්යේෂණ සභාවේ අනුමත කාර්ය මණ්ඩලය සඳහා 2006 වර්ෂයේ සිට කාර්ය පැවරුම් හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු බඳවා ගෙන තිබූ අතර එම නිලධාරීන් ස්ථිර තත්ත්වයට පත් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද කටයුතු කර නොතිබුණි.

4.7 අසාර්ථක ව්‍යාපෘති

----------------------

එකතුව රු. 15,682,293 ක් වැයකර නිමකල පර්යේෂණ ව්‍යාපෘති 07 කට අදාළව පර්යේෂණ වාර්තා ඇගැයීමෙන් පසුව එම ව්‍යාපෘති අසාර්ථක ව්‍යාපෘති/ අසතුටුදායක ව්‍යාපෘති ලෙස දක්වා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

5.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලින් බැහැර වීම

---------------------------------------------------

2011 වර්ෂයේ දී එකතුව රු. 32,290,822 ක් වටිනා උපකරණ 04 ක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ගෙන් බැහැරව මිලදීගෙන තිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබූ අතර අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අදාල අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ ද සහාය ලබාගෙන නොතිබුණි.

5.3 අයවැය ලේඛන පරීක්ෂාව

-------------------------------

2013 දෙසැම්බර් 31 දිනට අයවැයගත වියදම් ඉක්මවා තථ්‍ය වියදම් සියයට 13 සිට සියයට 82 දක්වා වැඩි වී තිබූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයන් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

---------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) පර්යේෂණ ප්‍රදාන

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ගිණුම්කරණ

(ඈ) අයවැය පාලනය

(ඉ) ව්‍යාපෘති කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න,
විගණකාධිපති (වැඩබලන)

# සම්බන්ධවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු

**ජාතික පර්යේෂණ සභාව**
**380/97, බෞද්ධාලෝක මාවත, කොළඹ 07**

**පොදු දුරකථන :** **011-2695060**
**ෆැක්ස් :** **011-2675136**
**ඊ මේල් :** nrc@sltnet.lk
**වෙබ් ලිපිනය :** www.nrc.gov.lk